
# 5 වැනි පරිච්ඡේදය

# විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

## 5.1 සමස්ත නිරීක්ෂණ


විදේශීය අංශයේ ඉහළ ක්‍රියාකාරීත්වය 2007 වසරේද තවදුරටත් ශක්තිමත්ව පැවැති අතර, වසරේ වැඩි කාලයක් පුරා පැවැති යහපත් ගෝලීය ආර්ථික වාතාවරණය මෙයට ප්‍රධාන වශයෙන් දායක විය. ගෙවුම් තුලනයේ අඛණ්ඩව, තෙවන වසරටත් අතිරික්තයක් වාර්තා විය. තියුණු ජාත්‍යන්තර තරගකාරිත්වය මධ්‍යයේ වුවද අපනයන තවදුරටත් ඉහළ වර්ධනයක් පෙන්වීය. විශේෂයෙන්ම වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ, යුරෝපා සංගමයේ වෙළෙඳපොළවලට පිවිසීමේ හැකියාව වැඩිවීම නිසා එම රටවලට කරනු ලැබූ අපනයනයන්හි වැඩිවීමක් දක්නට ලැබුණි. 2006 වසරේ සිට රෙදිපිළි හා ඇඟළුම් අපනයනයන් එ.ජ.ඩොලර් බිලියන 3 ඉක්මවන ප්‍රගතියක් වාර්තා කළ අතර 2007 වසරේ දී තේ අපනයන වටිනාකම එ.ජ.ඩොලර් බිලියන 1 ඉක්මවිය. ආයෝජන හා අතරමැදි භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම වැඩිවීමත්, ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඛනිජ තෙල් ඇතුළු අනෙකුත් වෙළෙඳ ද්‍රව්‍යයන්ගේ මිල තියුණු ලෙස වැඩිවීමත් නිසා ආනයන වියදම ද ඉහළයාමක් දක්නට ලැබුණි. ශ්‍රී ලංකාවේ අපනයන සමග සසඳා බලනවිට ජාත්‍යන්තර වෙළෙඳපොළේ අත්‍යවශ්‍ය ආනයන භාණ්ඩ කිහිපයක ඉහළ මිල ගණන් හේතුවෙන් රටෙහි වෙළෙඳ අනුපාතිකය සියයට 1 කින් පිරිහිණි. කෙසේ නමුත් තවදුරටත් පුළුල් වූ වෙළෙඳ හිඟය, වර්ධනය වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ තුළින් බොහෝ දුරට පියවීමට හැකිවිය. ප්‍රවාහනය, තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණ සේවා යනාදී සේවා අපනයන ඉපැයුම්වල වර්ධනයක් දක්නට ලැබුණ ද සංචාරක අංශයේ ඉපැයුම්වල පසුබෑමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත් වසරේ ප්‍රථම භාගයේ දී ශීඝ්‍රයෙන් පසුබෑමට ලක්වූ සංචාරක ව්‍යාපාරය වසරේ දෙවන භාගය වන විට ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්විය. සේවා ගිණුමේ අතිරික්තය හා ඉහළ ගිය විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ජංගම ගිණුමේ හිඟය සීමා කිරීමට හේතු වූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 2007 වසරේ දී ප්‍රගතියක් පෙන්නුම් කරයි.




ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ අතිරික්තයන් ජංගම ගිණුමේ හිඟය පියවීමටත් වඩා ප්‍රමාණවත් වූයෙන් සමස්ත ගෙවුම් තුලනයේ අතිරික්තයක් පෙන්වන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රටෙහි විදේශීය නිල සංචිත සතුටුදායක ලෙස වර්ධනය වූ අතර, එය මාස 3 කටත් වඩා ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය.

ජාත්‍යන්තර ආයෝජකයින් ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව දක්වන විශ්වාසනීයත්වය තහවුරු කරමින් රජය විසින් දියත් කළ ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව, තුන් ගුණයකටත් වඩා වැඩි ඉල්ලුමක් සහිතව සාර්ථක ලෙස නිමා කළේය. මෙම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සහ විදේශීය ආයෝජකයින් රුපියල්වලින් ප්‍රකාශිත රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම හේතුවෙන් රජය මෙතෙක් ලද ඉහළම විදේශීය ප්‍රාග්ධන ලැබීම් 2007 වසරේ දී වාර්තා කළේය. තවද, 2007 වසර තුළ දී උපලබ්ධිත විදේශීය සෘජු ආයෝජන සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර මෙතෙක් වාර්තා කළ ඉහළම අගය වූ 2006 වසරේ අගයද ඉක්ම විය. වසරේ පළමු කාර්තු 03 තුළ රුපියල, එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශීඝ්‍ර ලෙස අවප්‍රමාණය වූ නමුත් ප්‍රථම ස්වෛරී බැඳුම්කර නිකුතුව සමග ලැබුණු විදේශ විනිමය හේතුවෙන් අවසාන කාර්තුව තුළ දී රුපියල අධිප්‍රමාණය වූ අතර, වසර අවසානයේ දී සියයට 0.93 ක සුළු අවප්‍රමාණයක් වාර්තා කරමින් රුපියල ස්ථාවර විය. 2007 වසර තුළ දී ප්‍රාග්ධන ගිණුම තව දුරටත් විවෘත කරමින්, විදේශීය ආයෝජකයින්ට රුපියල්වලින් ප්‍රකාශිත රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කළ හැකි සීමාව, ඕනෑම අවස්ථාවක නොපියවා ඇති භාණ්ඩාගාර බැඳුම්කරවල වටිනාකමින් සියයට 10 දක්වා වැඩිකිරීම සිදුකළ අතර එමගින් රටට ලැබුණු විදේශීය අරමුදල් ප්‍රවාහය රුපියල තවදුරටත් අධිප්‍රමාණය වීමට හේතු විය. මෑතකාලීනව සිදුවූ රුපියලේ ස්ථාවර බව නිසා අපනයන සහ ආනයන ආදේශක අංශ ඵලදායීතාවය වර්ධනය කිරීම කෙරෙහි වැඩි අවධානය යොමුකිරීම තුළින් විදේශීය තරගකාරිත්වය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි. මේ අතර මුළු විදේශීය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ, සුළු වැඩිවීමක් දක්නට ලැබුණු අතර එයට ප්‍රධාන වශයෙන් රජය විසින් සිදුකළ ප්‍රථම ස්වෛරී ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව හා රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල සිදුවූ විදේශීය ආයෝජනයන් බලපා ඇත.

**5.1 රූප සටහන** **ගෙවුම් තුලනය**




**5.2 රූප සටහන** **ප්‍රධාන විදේශ විනිමය ඉපැයීමේ මූලයන්**




## 5.2 විදේශීය අංශයේ ප්‍රතිපත්තීන් සහ ආයතනික පහසුකම්

ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තවදුරටත් නිදහස් හා ලිහිල් ආර්ථික පරිසරයක භාණ්ඩ හා සේවා වෙළෙඳාම වර්ධනය කිරීමේ අභිප්‍රායෙන්, එහි ප්‍රධාන වෙළෙඳ පාර්ශ්වකරුවන් සමග ආර්ථික සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක විය. පූර්ණ විවෘතභාවයකින් යුතු ජංගම ගිණුමද, නිදහසේ පාවෙන විදේශ විනිමය අනුපාතය මෙන්ම, තවදුරටත් විවෘත වූ ප්‍රාග්ධන ගිණුමද, විදේශ අංශය නැංවීමට රුකුලක් විය. රජයේ අපනයන ප්‍රතිපත්තියේ අපේක්ෂාව වූයේ නිෂ්පාදනවල එකතු කළ අගය වැඩිකිරීමෙන් සහ මෙහි ප්‍රතිලාභ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය තුළින් අවම ආදායම් මට්ටම් වලට පවා ගලා යෑමට සැලැස්වීමය.

ආර්ථිකයේ විවෘතභාවය තවදුරටත් අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතීම, තීරුබදුවල සාමාන්‍ය අගය සියයට 4.1 වැනි පහළ අගයක පැවතීමෙන් පෙන්නුම් කෙරේ. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය බැඳුණු තීරුබදු මට්ටම වන සියයට 37.8 ක් වූ අගය සමග සැසඳීමේදී මෙය පහළ අගයකි. ශ්‍රී ලංකාව ලෝක වෙළෙඳ සංවිධානය (WTO) සමග නීතිමය වශයෙන් පවත්වාගෙන යාමට බැඳුණු තීරුබදු අගයන් (Bound Tariff) හෝ ඊට අඩු ප්‍රායෝගික තීරුබදු පවත්වාගෙන යායුතු වේ. තීරුබදු තවදුරටත් ප්‍රධාන වෙළෙඳ ප්‍රතිපත්ති නිර්ණායකය ලෙස භාවිතා විය. 2004 වසරේ දී හඳුන්වාදුන් සියයට 0, 2.5, 6, 15 සහ 28 යන කොටස් 5 කින් යුත් තීරුබදු ව්‍යුහය, 2007 වසරෙදීත් තවදුරටත් ක්‍රියාත්මක විය.

**5.1 සංඛ්‍යා සටහන**

## ගෙවුම් තුලන විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම (අ)

| ශීර්ෂය | එ.ජ.ඩොලර් දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2003 | 2004 | 2005 | 2006 | 2007 (ආ) | 2003 | 2004 | 2005 | 2006 | 2007 (ආ) |
| **වෙළෙඳ ශේෂය** | **-1,539** | **-2,243** | **-2,516** | **-3,370** | **-3,560** | **-148,324** | **-227,171** | **-253,082** | **-350,037** | **-394,327** |
| අපනයන | 5,133 | 5,757 | 6,347 | 6,883 | 7,740 | 495,426 | 583,967 | 638,276 | 716,579 | 856,808 |
| ආනයන | 6,672 | 8,000 | 8,863 | 10,253 | 11,301 | 643,750 | 811,138 | 891,359 | 1,066,615 | 1,251,135 |
| **සේවා (ශුද්ධ)** | **399** | **419** | **338** | **257** | **239** | **38,443** | **42,735** | **34,043** | **26,660** | **26,301** |
| ලැබීම් | 1,411 | 1,527 | 1,540 | 1,625 | 1,711 | 136,123 | 154,746 | 154,877 | 168,802 | 189,266 |
| ගෙවීම් | 1,012 | 1,108 | 1,202 | 1,368 | 1,473 | 97,680 | 112,011 | 120,833 | 142,142 | 162,965 |
| **ආදායම් (ශුද්ධ)** | **-172** | **-204** | **-299** | **-389** | **-358** | **-16,535** | **-20,688** | **-30,049** | **-40,424** | **-39.041** |
| ලැබීම් | 170 | 157 | 35 | 311 | 449 | 16,385 | 15,813 | 3,629 | 32,457 | 50,213 |
| ගෙවීම් | 341 | 360 | 335 | 700 | 807 | 32,920 | 36,501 | 33,678 | 72,881 | 89,254 |
| **භාණ්ඩ සේවා හා ආදායම (ශුද්ධ)** | **-1,312** | **-2,028** | **-2,478** | **-3,503** | **-3,679** | **-126,416** | **-205,124** | **-249,088** | **-363,801** | **-407,067** |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 1,205 | 1,350 | 1,736 | 1,904 | 2,214 | 116,350 | 136,672 | 174,542 | 197,861 | 245,006 |
| ලැබීම් | 1,414 | 1,564 | 1,968 | 2,161 | 2,502 | 136,475 | 158,291 | 197,968 | 224,678 | 276,814 |
| ගෙවීම් | 209 | 214 | 233 | 257 | 288 | 20,125 | 21,619 | 23,426 | 26,817 | 31,808 |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 36 | 30 | 93 | 101 | 97 | 3,441 | 3,038 | 9,300 | 10,524 | 10,677 |
| **ජංගම ගිණුම** | **-71** | **-648** | **-650** | **-1,499** | **-1,369** | **-6,625** | **-65,414** | **-65,246** | **-155,416** | **-151,383** |
| **ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම** | **722** | **631** | **1,224** | **1,808** | **2,097** | **69,723** | **60,539** | **123,866** | **190,768** | **230,978** |
| ප්‍රාග්ධන ගිණුම | 74 | 64 | 250 | 291 | 269 | 7,146 | 4,974 | 25,108 | 30,292 | 29,669 |
| ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ) | 74 | 64 | 250 | 291 | 269 | 7,146 | 4,974 | 25,108 | 30,292 | 29,669 |
| ලැබීම් | 81 | 71 | 257 | 299 | 278 | 7,768 | 5,643 | 25,863 | 31,171 | 30,735 |
| ගෙවීම් | 6 | 7 | 7 | 8 | 10 | 622 | 669 | 755 | 879 | 1,066 |
| **මූල්‍ය ගිණුම** | **648** | **567** | **974** | **1,517** | **1,828** | **62,577** | **55,565** | **98,757** | **160,477** | **201,309** |
| දිගු කාලීන | 722 | 680 | 798 | 907 | 1,251 | 69,721 | 69,805 | 80,391 | 95,089 | 140,054 |
| සෘජු ආයෝජන | 201 | 227 | 234 | 451 | 548 | 19,450 | 22,826 | 23,505 | 46,985 | 60,768 |
| විදේශීය සෘජු ආයෝජන (ශුද්ධ) | 171 | 217 | 234 | 451 | 548 | 16,557 | 21,948 | 23,505 | 46,985 | 60,768 |
| පෞද්ගලීකරණ ලැබීම් | 30 | 10 | - | - | - | 2,893 | 878 | - | - | - |
| පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ) | -33 | 14 | 11 | -35 | 31 | -3,201 | 2,270 | 1,054 | -3,590 | 3,314 |
| ලැබීම් | 101 | 169 | 197 | 139 | 199 | 9,738 | 17,503 | 19,739 | 14,469 | 22,033 |
| ගෙවීම් | 134 | 155 | 186 | 174 | 168 | 12,939 | 15,233 | 18,685 | 18,058 | 18,719 |
| රජයේ දිගුකාලීන (ශුද්ධ) | 554 | 439 | 553 | 491 | 672 | 53,472 | 44,709 | 55,832 | 51,694 | 75,971 |
| ලැබීම් | 913 | 771 | 747 | 932 | 1,290 | 88,106 | 78,299 | 75,309 | 97,690 | 144,146 |
| ගෙවීම් | 359 | 331 | 194 | 441 | 618 | 34,634 | 33,590 | 19,477 | 45,996 | 68,175 |
| කෙටිකාලීන | -75 | -112 | 176 | 610 | 577 | -7,145 | -14,240 | 18,366 | 65,387 | 61,256 |
| විවිධ ආයෝජන (ශුද්ධ) | 2 | 11 | 60 | 51 | 101 | 209 | 1,109 | 6,103 | 5,377 | 11,249 |
| පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ) | 19 | 28 | 16 | -30 | 20 | 1,877 | 2,514 | 1,640 | -3,066 | 1,868 |
| වාණිජ බැංකු වත්කම් (ශුද්ධ) | -94 | -354 | -223 | 297 | -281 | -9,090 | -45,367 | -19,669 | 23,789 | -31,352 |
| වාණිජ බැංකු වගකීම් (ශුද්ධ) | -2 | 202 | 323 | 293 | 364 | -141 | 27,504 | 30,292 | 39,287 | 38,746 |
| රජයේ කෙටිකාලීන (ශුද්ධ) | - | - | - | - | 372 | - | - | - | - | 40,744 |
| වැරදීම් හා අත්හැරීම් | -148 | -189 | -72 | -105 | -198 | -14,487 | -2,599 | -10,494 | -1,830 | -19,593 |
| **සමස්ත ශේෂය (ඇ)** | **502** | **-205** | **501** | **204** | **531** | **48,610** | **-7,474** | **48,125** | **33,523** | **60,002** |
| මූල්‍ය වෙනස්වීම් (ඇ) | -502 | 205 | -501 | -204 | -531 | -48,610 | 7,474 | -48,125 | -33,523 | -60,002 |
| වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය | | | | | | | | | | |
| ශ්‍රී ලං. රු./ එ.ජ. ඩොලර් | | | | | | 96.52 | 101.19 | 100.50 | 103.96 | 110.62 |
| ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස | | | | | | | | | | |
| වෙළෙඳ ගිණුම | -8.1 | -10.9 | -10.3 | -11.9 | -11.0 | -8.1 | -10.9 | -10.3 | -11.9 | -11.0 |
| ජංගම ගිණුම (ඈ) | -0.4 | -3.1 | -2.7 | -5.3 | -4.2 | -0.4 | -3.1 | -2.7 | -5.3 | -4.2 |
| ප්‍රදානයන් හැර ජංගම ගිණුම | -0.6 | -3.3 | -3.0 | -5.7 | -4.5 | -0.6 | -3.3 | -3.0 | -5.7 | -4.5 |

(අ) මෙම සංඛ්‍යා ගෙවුම් තුලන අත්පොතේ 5 වන සංස්කරණය (1993) ට අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන අයුරින් සකස් කොට ඇත. මීට අමතරව 1994 සිට අක්වෙරළ බැංකු ඒකකද දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකා ඇත.

(ආ) තාවකාලික

(ඇ) එ.ජ.ඩොලර් වලින් දක්වා ඇති සංඛ්‍යා රුපියල් වටිනාකම්වලට පරිවර්තනය කර ඇත්තේ කාලපරිච්ඡේද අවසානයේ පැවති විනිමය අනුපාතිකයන්ට අනුවය.

(ඈ) 2003 වසරේ සිට ද.දේ.නි. යට අදාල දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලැබේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.2 සංඛ්‍යා සටහන** **සාමාන්‍ය ආනයන බදු එකතු කිරීමේ අනුපාත (අ)**

| ශීර්ෂය | 2003 | 2004 | 2005 | 2006 | 2007(ආ) |
|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **13.5** | **10.4** | **10.4** | **11.2** | **12.4** |
| ආහාර හා පාන වර්ග | 14.2 | 8.5 | 9.6 | 10.7 | 13.5 |
| සහල් | 29.3 | 4.9 | 10.6 | 23.4 | 3.1 |
| පිටි | 11.5 | 7.2 | 3.8 | 33.7 | 31.9 |
| සීනි | 16.8 | 4.6 | 1.5 | 1.9 | 23.9 |
| තිරිඟු හා ධාන්‍ය | 0.0 | 0.1 | 1.1 | 5.6 | 6.3 |
| කිරි හා කිරි නිෂ්පාදන | 12.2 | 7.9 | 10.2 | 9.6 | 7.7 |
| කරවල | 10.8 | 5.9 | 5.9 | 5.0 | 2.9 |
| වෙනත් මාළු නිෂ්පාදන | 7.9 | 10.0 | 9.8 | 7.8 | 4.9 |
| වෙනත් | 22.3 | 17.4 | 22.0 | 24.2 | 20.8 |
| **ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ** | **13.0** | **12.2** | **11.1** | **11.7** | **11.2** |
| මෝටර් රථ හා යතුරු පැදි | 22.1 | 21.1 | 18.9 | 18.3 | 16.3 |
| විද්‍යුත් උපකරණ | 8.9 | 9.4 | 13.6 | 7.1 | 7.7 |
| රබර් ටයර් හා ටියුබ් | 26.0 | 25.8 | 26.2 | 19.2 | 22.4 |
| බෙහෙත් හා ඖෂධ නිෂ්පාදන | 0.6 | 0.6 | 0.5 | 0.3 | 0.4 |
| වෙනත් | 9.2 | 8.9 | 8.7 | 10.3 | 10.6 |
| **අන්තර් භාණ්ඩ** | **1.5** | **1.9** | **2.1** | **1.5** | **1.5** |
| පොහොර | 2.6 | 3.1 | 2.7 | 2.5 | 2.7 |
| බොරතෙල් | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 |
| වෙනත් ඛනිජ තෙල් | 0.8 | 0.9 | 1.9 | 2.3 | 1.6 |
| රසායන ද්‍රව්‍ය හා සංයෝග | 2.2 | 2.6 | 2.0 | 1.8 | 1.9 |
| ඩයි වර්ග, පදම් කිරීමේ හා වර්ණ වර්ග | 4.6 | 4.5 | 4.4 | 2.6 | 2.5 |
| කඩදාසි | 5.4 | 6.0 | 6.0 | 2.4 | 2.2 |
| රෙදිපිළි | 0.1 | 0.0 | 0.1 | 0.1 | 0.1 |
| වෙනත් | 3.3 | 4.3 | 4.5 | 3.3 | 3.3 |
| **ආයෝජන භාණ්ඩ** | **7.2** | **6.1** | **5.8** | **5.2** | **4.8** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 7.7 | 9.0 | 7.8 | 9.2 | 7.2 |
| ගමනාගමන උපකරණ | 12.9 | 11.9 | 9.7 | 7.0 | 7.1 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 5.6 | 3.2 | 3.3 | 3.2 | 2.7 |
| වෙනත් | 4.6 | 5.0 | 5.3 | 3.4 | 4.2 |
| **සාමාන්‍ය බදු අනුපාතය** | **5.3** | **4.5** | **4.6** | **4.3** | **4.1** |

(අ) මුළු තීරුබදු එකතුව මුළු ආනයන වටිනාකමෙහි (මි. ර. ගැ.) ප්‍රතිශතයක් ලෙස
(ආ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම

ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ගිවිසුම් යටතේ ආනයන සඳහා වරණීය තීරුබදු ප්‍රකාශයට පත් කෙරිණි. මෙම ප්‍රවණතාවයන් විදේශ වෙළෙඳාමෙහි, වෙළෙඳපොළට පිවිසීමට ඇති හැකියාව, එහි විනිවිද භාවය සහ නිශ්චිතභාවය ඉහළ නැංවීමට හේතු විය. කෙසේ වෙතත්, 2007 වසරේ උත්සව සමයන් හි පාරිභෝගිකයන්ට සහන සැලසීමේ සහ ආනයන භාණ්ඩ ප්‍රමාණය ක්ෂණිකව ඉහළ යාමෙන් දේශීය නිෂ්පාදකයින් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය නිසා, පාරිභෝගික භාණ්ඩ මත පැනවූ තීරුබදු වෙනස්වීම්වලට භාජනය විය. 2007 වසරේ දී ආනයන හා අදාළ අනෙකුත් ගාස්තු වූයේ, සියයට 10 රේගු බදු අධිභාරය, එකතු කළ අගය මත බද්ද, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද, සමාජ වගකීම් ගාස්තු, මත්පැන්, දුම්කොළ නිෂ්පාදන සහ රථ වාහන සඳහා අදාළ වන නිෂ්පාදන බදු සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ මත පනවන ලද සෙස් බද්ද යනාදියයි. මේ අතර තෝරාගත් ආහාර හා පාන වර්ග 10 ක් මත එක් රේගු බද්දක් පමණක් පනවා ඒ සඳහා අදාළ අනෙකුත් ගාස්තු ඉවත් කරන ලදී.

**ශ්‍රී ලංකාව, ද්වීපාර්ශ්වික සහ කලාපීය වෙළෙඳ ගිවිසුම්වලට එළඹ සිටිය ද, ජගත් වෙළෙඳ ක්‍රියාදාමයට ප්‍රවිශ්ට වීම සඳහා වන දිගුකාලීන උපක්‍රමයක් ලෙස ලෝක වෙළෙඳ සංවිධානයේ බහුපාර්ශ්වික වෙළෙඳ මැදිහත්වීම් වලට සහයෝගය දැක්වීය.** දේශීය ආර්ථිකය විදේශ වෙළෙඳ පාර්ශ්වයන් හා බද්ධ වීම අපේක්ෂා කරමින් ඇති කරගත් විවිධ වෙළෙඳ ගිවිසුම්වලින්, එම ගිවිසුම්වල සඳහන් ප්‍රතිලාභවලට පමණක් සීමානොවී වෙනත් අතුරු ප්‍රතිලාභ රාශියක් ලැබීමටද අවස්ථාව සැලසී ඇත. ශ්‍රී ලංකාව සාම්ප්‍රදායිකව අනෙකුත් ආසියා රටවල් සමග තිබූ බැඳීම් ශක්තිමත් කිරීමට සහ ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ වෙළෙඳ කේන්ද්‍රස්ථානය බවට පත්කිරීමේ අපේක්ෂාවෙන් කලාපීය වෙළෙඳ සහයෝගීතාවයන්හි ක්‍රියාකාරී සාමාජිකයෙක් ලෙස නිරන්තරයෙන් සහයෝගය දෙනු ලැබීය. මෙලෙස කලාපීය සහයෝගීතාවය නැංවීම සඳහා ශ්‍රී ලංකාව, දකුණු ආසියා වෙළෙඳ ගිවිසුම (SAFTA), ආසියා-ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (APTA), බහුආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය උදෙසා වන බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලිකත්වය (BIMSTEC) සහ ඉන්දීය සාගර කවය කලාපීය සහයෝගීත්වය සඳහා සංවිධානය (IORARC) වැනි ගිවිසුම්වල ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස නිරතුරුවම ක්‍රියා කළේය.

**ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමේ (ISLFTA) මාර්ගෝපදේශවලට අනුව ක්‍රියාත්මක වන, අනුක්‍රමිකව තීරුබදු ලිහිල් කිරීම මගින්, සංවේදී නොවන භාණ්ඩ සඳහා තිබූ ආරක්ෂණය ක්‍රමක්‍රමයෙන් ඉවත් කරගෙන යමින් පවතී.** දේශීය නිෂ්පාදකයන්ට සංවේදී භාණ්ඩ හැර, ඉන්දියාවෙන් ආනයනය කරන අනෙකුත් සියලු භාණ්ඩ, 2008 මාර්තු මස අවසානය සිට තීරු බදු රහිතව දේශීය වෙළෙඳපොළට ඇතුළුවනු ඇත. මෙවැනි සහන ශ්‍රී ලංකාවට 2003 වසර වැනි දිගු කලකට පෙර සිට ලැබී තිබුණ ද, ශ්‍රී ලංකාව තවමත් අපනයන ද්‍රව්‍ය කිහිපයක් පමණක් මත රැඳී පවතින අතර අපනයන විවිධාංගීකරණය මන්දගාමී වී ඇත. එම නිසා දේශීය අපනයනකරුවන්, ඉන්දියාව වැනි ශීඝ්‍රයෙන් දියුණු වන ආර්ථිකයක් ඇති රටක් සමග පවතින මෙවැනි ගිවිසුමකින් ලැබී ඇති ප්‍රතිලාභවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට උත්සුක විය යුතුය. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර යෝජිත විස්තීර්ණ ආර්ථික සහයෝගීතා ගිවිසුම (CEPA) යටතේ පැවැත්වූ සාකච්ඡා මගින් රටවල් දෙක අතර පැවතුණු සමහරක් වෙළෙඳ බාධක ඉවත්කර ගැනීමට හැකිවිය. යෝජිත විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමහි එක් ස්ථාවරයක් වූයේ දෙරට අතර භාණ්ඩ හුවමාරුවේ ප්‍රසාරණයක් ඇති කිරීමය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාවේ, කල්කටාව හා කොචින් වරායන් හරහා පමණක් තේ ආනයනය කිරීමට සැලසීමෙන්, මතුව තිබූ බාධක ඉවත් කිරීමට එකඟ විය. මෙම බාධක ඉවත්කිරීමත් සමඟ ලාංකික තේ අපනයනකරුවන්ට ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ

ගිවිසුම යටතේ තේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 12.5 ක් සඳහා ලබාදුන් තීරුබදු පංගු (TRQ) ප්‍රයෝජනයට ගැනීමට හැකි වනු ඇත. තවද, ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ඇඟළුම් කැබලි දශ ලක්ෂ 3 ක් දක්වා රෙදිපිළි සඳහා කිසියම් ප්‍රභව ස්ථාන නියම කිරීමකින් තොරව හා වරාය සම්බන්ධ බාධක වලින් තොරව තීරුබදු පංගු ලබාදීමට එකඟ වී ඇත. මෙය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇත.

**පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSLFTA) 2005 වසරේ දී ක්‍රියාත්මක වීමත් සමග 2007 වසර වන විට ශ්‍රී ලංකාව විසින් පකිස්ථානයට කරනු ලැබූ අපනයන සියයට 27 කින් වර්ධනය විය.** 2007 වසර වන විට ශ්‍රී ලාංකික අපනයන සඳහා පකිස්ථානු වෙළෙඳපොළ තුළ සියයට 67 ක තීරුබදු සහනයක් ලැබුණ නමුදු, පකිස්ථාන භාණ්ඩ සඳහා ශ්‍රී ලංකා වෙළෙඳපොළෙහි සියයට 40 ක තීරුබදු සහනයක් පමණක් ලැබුණි. එනමුදු ශ්‍රී ලංකාවේ අපනයන අපේක්ෂා කළ ආකාරයට වැඩි නොවීම හේතුවෙන් වෙළෙඳ ශේෂය තව දුරටත් පකිස්ථානයට වාසිදායකව පවතී. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයනයන් වන තේ සහ ඇඟළුම්, වරණ ලැයිස්තුවට ඇතුළත් වූ නමුත් මෙම භාණ්ඩ සඳහා තීරුබදු පංගු සහන සහ වරණීය තීරුබදු සහන ද සලසා ඇත. නමුත් තීරුබදු පංගු වල ඌණ උපයෝජන හේතුවෙන්, පකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ දේශීය අපනයනවල ක්‍රියාකාරිත්වය දුර්වල වී ඇත. තීරුබදු රහිතව වසරකට තේ මෙ.ටො. 10,000 ක්, සියයට 35 ක වරණීය තීරුබදු සහනයක් සහිතව වසරකට බුලත් කොළ මෙ.ටොන් 1,200 ක් සහ තීරුබදු රහිතව ඇඟලුම් කැබලි දශලක්ෂ තුනක් තීරුබදු පංගු සහන යටතේ පකිස්ථානයට අපනයනය කිරීමට ඉඩ සලසා ඇත. දෙරට විසින්ම යෝජිත විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමක් යටතේ, දැනට පවත්නා වෙළෙඳ ගිවිසුමේ විෂය පථය සේවා, ආයෝජන සහ රේගු සහයෝගිතා වයන් ද ආවරණය වන පරිදි පුළුල් කිරීම මගින් දෙරට අතර වෙළඳාම සහ ආයෝජන තව දුරටත් පුළුල් කරමින් ද්විපාර්ශික සබඳතා වර්ධනය කිරීමටද එකඟ වී ඇත.

**වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ පුළුල්වූ වෙළෙඳපොළ ප්‍රවේශය හේතුකොටගෙන ශ්‍රී ලංකාවට යුරෝපීය වෙළෙඳපොළ තුළ වාසිදායක අවස්ථා රැසක් උදාවිණි.** වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය යටතේ ඇඟළුම් සඳහා ලැබුණු සහනයන්, විදේශ වෙළෙඳපොළේ අභියෝගයන්ට මුහුණ දීමට සහ කොන්ත්‍රාත් සඳහා නිෂ්පාදනය කරන්නෙකු වශයෙන් පැවති ශ්‍රී ලාංකික ඇඟළුම් කර්මාන්තය පරිපූර්ණ සේවා සපයන්නෙකු බවට පරිවර්තනය වීමට සහාය විය. වෙළෙඳ වාරණයන් පිළිබඳ පොදු ක්‍රමයෙහි පරමාර්ථවලට අනුගාමීව සිදුකෙරෙන පසුපසට ඒකාබද්ධ කිරීම (Backward Integration) තුළින් ලබාගන්නා ශීඝ්‍ර කාර්මීකරණය නිසා විවිධ කර්මාන්තවල පැහැදිලි ප්‍රගතියක් දක්නට ලැබේ. ප්‍රධාන ඇඟළුම් අපනයනකරුවන් විසින් විශාල රෙදි ගෙතීමේ හා ඒ හා සම්බන්ධ වෙනත් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තශාලා පිහිටුවීම පමණක් නොව මුළු ඇඟළුම් කර්මාන්තයේ ධාරිතාව වැඩි කිරීමට අවධානය යොමු කරන ලදී. සදාචාරාත්මක හා තිරසාර පිළිවෙත්වලට ඇති කැපවීමත් සමඟ ලාභ සහ සමාජීය හා පාරිසරික අවශ්‍යතා අතර තුලනයක් රැකගනිමින්, ජාත්‍යන්තර මට්ටමේ වෙළෙඳ නාමයන් සහිතව නිමි ඇඳුම් සකසන සමාගම්වලට පරිපූර්ණ සේවා සපයන්නකු බවට පත්වීමට ඇඟළුම් අපනයනකරුවන් විසින් උත්සාහ කරනු ලැබේ.

**ඉරාන - ශ්‍රී ලංකා ද්විපාර්ශවික සබඳතාවයන් 2007 වසරේ දී දැවැන්ත පියවරක් තැබුවේය.** රටවල් දෙක මගින් ආර්ථිකමය, වෙළෙඳ, සංස්කෘතික, විද්‍යාත්මක සහ තාක්ෂණික අංශ ඔස්සේ අන්‍යෝන්‍ය සහයෝගීතාවය තව දුරටත් වර්ධනය කිරීමට අධිෂ්ඨානය මෙමගින් විදහා දක්වයි. මෑතකදී පැවැත් වූ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය, සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීමේ ව්‍යාපෘතිය, නාවික කටයුතු පිළිබඳ සහයෝගීතාවය, රේගු කටයුතු පිළිබඳ සහයෝගීතාව සහ සිව්මසකට පොළී රහිතව ඛනිජ තෙල් මිල දී ගැනීමේ ණය ගිවිසුම ආදිය ඇතුළත් අන්‍යෝන්‍ය අවබෝධතා ගිවිසුම් රාශියකට අත්සන් තබන ලදී. තවද, දෙරට අතර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමට ද එකඟතාවය පල කෙරිණි.

**සීමිත දේශීය ඉල්ලුමක් සහිත ශ්‍රී ලංකාව වැනි කුඩා රටක් කුඩා පරිමානයෙන් භාණ්ඩ නිපදවීම, සෙසු තරගකරුවන්ට සාපේක්ෂව නිෂ්පාදන පිරිවැය වැඩිවීමට හේතුවේ.** ගුණාත්මකභාවය නිසා විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවේ තේ සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ විශේෂ ස්ථානයක් ඇති ආකාරයෙන්ම, අනෙකුත් අපනයන භාණ්ඩ සඳහා ද ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ විශේෂත්වයක් ලබා ගැනීම සඳහා තම භාණ්ඩ උසස් ගුණාත්මක භාවයෙන් ඉදිරිපත් කළ යුතුය. මෙම ක්‍රියාවලිය සඳහා භාණ්ඩ වල එකතු කළ අගය වැඩි කළ යුතු අතර, එමගින් ශ්‍රී ලාංකික වෙළෙඳ නාමයන් බිහි වීමේ ක්‍රියාවලියකට පදනම වැටෙනු ඇත. සැපයුම්දාමයේ ඇති වූ ගැටළු හේතුකොට ගෙන ජාත්‍යන්තර තේ මිල 2007 වසරේ දී ඉහළ ගිය නමුත්, ශ්‍රී ලංකා තේ සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ සාපේක්ෂව තවත් ඉහළ මිලක් ලබාගැනීමට හැකිවිය. නමුත් ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තේ සඳහා මෙන්ම අනෙක් භාණ්ඩ සඳහා ද වඩා ඉහළ ස්ථානයක් ලබා ගැනීම සඳහා විවිධ ජාත්‍යන්තර ප්‍රමිතීන් සම්බන්ධයෙන් අවශ්‍ය සහතික තත්ත්වයන් ලබාගතයුතු වේ. ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ සුවිශේෂ ස්ථානයක් හිමිකර ගැනීමේ උත්සාහයේ දී, ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය, සදාචාරාත්මක

**විශේෂ සටහන 12**

## වරණීය වෙළෙඳ පිවිසුම සහ එහි බලපෑම

නිදහස් වෙළෙඳ ගිවිසුම්වලට මග සලසන වරණීය වෙළෙඳ සැකසුම් රටවල් දෙකක් අතර වන ද්විපාර්ශ්වීය හෝ රටවල් වැඩි සංඛ්‍යාවක් (එහෙත් මුළු ලෝකයම නොවන) අතර වන බහු පාර්ශවීය ගිවිසුම් වේ. මෙම වෙළෙඳ ගිවිසුම් මගින් ඊට සහභාගිවන රටවල් අතර වෙළෙඳ සම්බාධක අවම කරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඊට සම්බන්ධවන රටවල් අතර ආර්ථික සහයෝගීතාවය ඉහළ නංවයි. විශේෂයෙන්ම, මෙම වෙළෙඳ ගිවිසුම් තුළින් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ අත්කර දීමේ පදනම මත තම සාමාජික රටවල තීරු බදු අඩුකිරීම මගින් වෙළෙඳ පොළට ප්‍රවේශවීමේ හැකියාව පුළුල් කරයි. නිදහස් වෙළෙඳ ගිවිසුම් මගින් සියළුම සාමාජිකයනට සමාන ආකාරයකින් පොදු වෙළෙඳ පොළ තුළ ක්‍රියාත්මක වීමට අවශ්‍ය පසුබිමක් නිර්මාණය කළ අතරම විවෘතව සහ විනිවිද භාවයෙන් යුතුව කටයුතු කිරීමට සාමාජික රජයන් පොළඹවනු ලැබේ. අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ අත්කර ගැනීම මත පදනම්ව නිදහස් වෙළෙඳ ගිවිසුම් හරහා වෙළෙඳාම පමණක් නොව සෘජු විදේශ ආයෝජන මෙන්ම රජයේ ප්‍රතිසම්පාදන යන ආදිය ද ඇතුළත්ව කටයුතු කරමින්, අදාළ සියලුම පාර්ශවයන් ජයග්‍රහණය කරා ගෙනයාමේ පරිසරයක් නිර්මාණ කෙරේ. නිදහස් වෙළෙඳ ගිවිසුම් තුළින් සෘජු ප්‍රතිලාභ මෙන්ම ඒ තුළින් ජනිතවන අනියත් ප්‍රතිලාභ සාමාජික රටවල සියලුම අංශ කරා ගමන් කෙරේ.

වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය වැනි අන්‍යොන්‍ය වශයෙන් පරස්පර නොවන ඒක පාර්ශවීය නිදහස් වෙළෙඳ ගිවිසුමකින් ශ්‍රී ලංකාව ඉමහත් ප්‍රතිලාභ අත්කර ගෙන ඇත. අන්තර් ජාතික ගිවිසුම් 27 ක් මත පදනම්ව යහ පාලනය, මානව අයිතිවාසිකම් හා පාරිසරික මෙන්ම කම්කරු ප්‍රමිතීන් තහවුරු කිරීම හා ක්‍රියාවට නැංවීම අරමුණු කොටගෙන, ශ්‍රී ලංකාව වැනි රටවලට යුරෝපා සංගමයේ රටවල වෙළෙඳ පොලට ප්‍රවේශවීම සඳහා සහන වෙළෙඳ වරණයක් පිළිබඳව පොදු ක්‍රමය (GSP+) යටතේ ප්‍රදානය කරන ලදී. යුරෝපා සංගමය විසින්, සෑම වසර 3 කටම වරක් මෙම ගිවිසුම හා බැඳි ක්‍රියාකාරීත්වය නැවත සමාලෝචනය කරන අතර, වර්තමාන ගිවිසුම 2008 වර්ෂයේ අග භාගයේදී සමාලෝචනය කෙරේ. අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ අත්නොවන මෙවැනි ගිවිසුම් තව දුරටත් නොකඩවා පැවතීම, ඉහත සඳහන් කල ප්‍රමිතීන්වල සාර්ථකත්වය තහවුරු කිරීම සහ ක්‍රියාවට නැංවීම පමණක් මත රඳා නොපවතින අතර ඒ සඳහා යුරෝපා සංගමයේ රටවල සමාජ, දේශපාලන හා වෙළෙඳ ප්‍රතිපත්ති මගින්ද බලපෑමක් ඇති කරන නිසා, වරණීය සහනාධාර අඛණ්ඩව ලැබීම් පිළිබඳව අවධානමක් ඇත.

නිදහස් වෙළෙඳ ගිවිසුම් සහ වෙළෙඳ වරණයන් පිළිබඳව වූ පොදු ක්‍රමය හරහා ලැබෙන ප්‍රතිලාභ ස්වභාවයෙන්ම කෙටිකාලීන වේ. ප්‍රතිලාභ ලබන රටවල අපනයන සඳහා ලැබෙන සහන අත්හිටුවීමෙන් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ අත්නොවන ගිවිසුම් ඕනෑම අවස්ථාවක අවසන් කළ හැකි වේ. එමෙන්ම, අනියත් නිදහස් වෙළෙඳ ගිවිසුම් හරහා ලැබෙන ප්‍රතිලාභ ද කාලයත් සමග ක්‍රමයෙන් අඩුවී යා හැකිය. සාර්ථක ලෙස නිදහස් වෙළෙඳ ගිවිසුම් ක්‍රියාත්මක වීමත් සමග ඊට පරිබාහිරව ඇති රටවලට මෙහි සාමාජිකත්වය ලබා ගැනීමට හෝ නව නිදහස් වෙළෙඳ ගිවිසුම් පිහිටුවා ගැනීමට අනුබලයක් ලැබේ. එම නිසා රටවල් විසින් විශේෂයෙන්ම, තවත් විශාල රාජ්‍යයන් සමග වරණීය වෙළෙඳ ගිවිසුම් ඇතිකර ගැනීමට උත්සාහ දරන අතර එමනිසා නිදහස් වෙළෙඳ ගිවිසුම්වල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන වෙළෙඳ වරණයන් ක්‍රමයෙන් හීන වී යා හැකිය.

මේ අතරම, නිදහස් වෙළෙඳ ගිවිසුම් සහ වෙළෙඳ වරණයන් පිළිබඳව වූ පොදු ක්‍රමය තුළින් අත්වන කෙටිකාලීන ප්‍රතිලාභ මත පමණට වඩා රඳා පැවතීමෙන් සම්පත් ඵලදායි ලෙස නොබෙදී යා හැකිය. එවැනි සම්පත් බෙදී යාමකදී වෙළෙඳ වරණයන් හින වී යන අවස්ථාවක හෝ තීරුබදු සහන ඉවත් කර ගැනීමකදී මෙම සම්පත් අපතේ යාමක් සිදුවනු ඇත.

නිදහස් වෙළෙඳ ගිවිසුම් මගින් සැලසෙන කෙටිකාලීන සහනාධාර උපකාරී කරගනිමින් පවත්නා විදේශ වෙළෙඳ පොළ තහවුරු කරගත යුතු අතර විදේශ වෙළෙඳපොළට පිවිසීමේ තරගකාරීත්වය මෙන්ම තිරසාර බව පවත්වා ගැනීමට අදාළ පාර්ශව විසින් නිසිකාලීනව අදාළ උපාය මාර්ග ගැනීමේ වැදගත්කම ඉස්මතු වී ඇත. දිගුකාලීන උපාය මාර්ග සමග වරණීය වෙළෙඳ ගිවිසුම් තුළින් ලබා ගන්නා අත්දැකීම්, නිදහස් වෙළෙඳ ගිවිසුම් සහ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ අත්නොවන වෙළෙඳ වරණයන් පිළිබඳව වූ පොදු ක්‍රමය වැනි ගිවිසුම් මත පමණට වඩා රඳා නොපැවතමින්, ගෝලීය වශයෙන් තරගකාරී ආයතන බවට පත්වීමට උපකාරී වේ.

රටක විදේශ වෙළෙඳාමේ අනාගතය නිතරම සාපේක්ෂ වාසි මත රඳා පවතින අතර වර්තමානයේදී එය තරගකාරී වාසි පිළිබඳව අවධානය යොමුකර තිබේ. නවීන ලෝකයේ තොරතුරු හා සංනිවේදන තාක්ෂණය වැදගත් ස්ථානයක් හිමිකර ගන්නා සේම තරගකාරී වාසි අත්කරගැනීම විදේශ වෙළෙඳ පොළ ප්‍රසාරණයට බලපාන ප්‍රධාන නිර්ණායකය බවට පත්වී ඇත. මේ නිසා විදේශ වෙළෙඳ පොළේ ප්‍රතිවාදි නිෂ්පාදිත සමග සාර්ථක ලෙස තරග කිරීමට දේශීය කර්මාන්ත ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය නැංවීම සිදුකළ යුතුව ඇත.

ප්‍රමිතීන් යටතේ නිපැයූ ඇඟළුම් (Garments without Guilt) තේමාව ඔස්සේ ඇඟළුම් ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මෙවැනි පිළිගත් නිෂ්පාදන ප්‍රමිතීන් අතර ග්‍රාමීය රැකියා සැපයීම, කාන්තාවන් සවිබල කිරීම සහ ළමා ශ්‍රමය යොදා නොගැනීම ආදිය ඇතුළත් වේ. ඓතිහාසිකව, ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශක්තිය පැවතුණේ ජාත්‍යන්තර වෙළෙඳපොළට උසස් තත්ත්වයේ කුරුඳු, ලංකා කාකතිල් (Ceylon Sapphire) ලංකා තේ, උසස් ප්‍රමිතියේ කොප්පරා සහ පිඟන් භාණ්ඩ වැනි උසස් ගනයේ භාණ්ඩ සම්බන්ධයෙනි. මෙම කර්මාන්ත මෑත කාලයේ තාක්ෂණ හා නිෂ්පාදන ප්‍රවර්ධන ක්‍රම මගින් තවත් වැඩි දියුණු වී ගුණාත්මකව වර්ධනය වී ඇත. වෙළෙඳ ගිවිසුම් මගින් අපනයනකරුවන්ට, අපනයන භාණ්ඩ තීරුබදු රහිතව හෝ වරණීය තීරු බදු සහිතව අපනයනය කිරීමට අවස්ථාවන් ලැබිණ. නමුත් විදේශ වෙළෙඳ පාර්ශ්වකරුවන් අනෙකුත් රටවල් සමග ද මෙලෙස ගිවිසුම් ඇතිකරගන්නා අතර ජාත්‍යන්තර වෙළෙඳ සංවිධානය සමග ඇතිකෙරෙන තීරුබදු අඩුකිරීම් වැනි බැඳීම්වලට ද එකඟ වන බව සඳහන් කළ යුතුය.

**5.3 සංඛ්‍යා සටහන**

**වෙළෙඳ දර්ශක (අ)**

| ශීර්ෂය | 2006 | | | 2007 (ආ) | | | වර්ධන වේගය (ආ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම් දර්ශකය | පරිමා දර්ශකය | ඒකක වටිනාකම් දර්ශකය | වටිනාකම් දර්ශකය | පරිමා දර්ශකය | ඒකක වටිනාකම් දර්ශකය | වටිනාකම් දර්ශකය | පරිමා දර්ශකය | ඒකක වටිනාකම් දර්ශකය |
| අපනයන | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **121.7** | **122.3** | **99.5** | **141.9** | **125.9** | **112.7** | **16.6** | **2.9** | **13.3** |
| තේ | 122.2 | 124.0 | 98.6 | 142.2 | 122.1 | 116.5 | 16.3 | -1.5 | 18.2 |
| රබර් | 118.4 | 77.0 | 153.8 | 139.0 | 85.8 | 162.1 | 17.5 | 11.5 | 5.4 |
| පොල් | 105.3 | 112.4 | 93.7 | 120.0 | 124.1 | 96.7 | 14.0 | 10.4 | 3.2 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 134.2 | 146.8 | 91.4 | 159.7 | 167.9 | 95.1 | 19.0 | 14.4 | 4.1 |
| **කාර්මික අපනයන** | **156.4** | **150.3** | **104.0** | **172.0** | **163.0** | **105.5** | **10.0** | **8.4** | **1.4** |
| රෙදිපිළි හා ඇඟළුම් | 135.2 | 141.2 | 95.7 | 146.6 | 150.8 | 97.2 | 8.5 | 6.8 | 1.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 193.5 | 64.9 | 298.3 | 173.5 | 57.5 | 301.7 | -10.4 | -11.4 | 1.1 |
| වෙනත් | 199.9 | 177.6 | 111.7 | 226.0 | 198.6 | 113.8 | 13.0 | 11.8 | 1.9 |
| **ඛනිජ ද්‍රව්‍ය අපනයන** | **134.2** | **120.7** | **126.5** | **144.6** | **132.7** | **109.0** | **7.7** | **10.0** | **-13.9** |
| මැණික් | 124.3 | 119.9 | 120.2 | 128.6 | 126.3 | 101.8 | 3.5 | 5.3 | -15.3 |
| වෙනත් | 264.8 | 130.3 | 203.2 | 354.3 | 216.6 | 163.6 | 33.8 | 66.2 | -19.5 |
| **මුළු අපනයන** | **148.1** | **143.3** | **103.3** | **166.5** | **153.8** | **108.3** | **12.5** | **7.3** | **4.8** |
| ආනයන | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **164.4** | **175.9** | **93.5** | **163.1** | **167.2** | **97.6** | **-0.8** | **-4.9** | **4.4** |
| ආහාර හා පාන වර්ග | 118.0 | 108.7 | 108.5 | 129.4 | 116.8 | 110.8 | 9.7 | 7.5 | 2.1 |
| වෙනත් | 231.8 | 273.5 | 84.8 | 212.1 | 240.4 | 88.2 | -8.5 | -12.1 | 4.1 |
| **අන්තර් භාණ්ඩ** | **190.4** | **146.2** | **130.2** | **208.5** | **147.5** | **141.4** | **9.5** | **0.8** | **8.6** |
| පොහොර | 247.1 | 162.1 | 152.5 | 290.0 | 145.8 | 199.0 | 17.3 | -10.1 | 30.5 |
| බොර තෙල් | 389.7 | 118.7 | 328.4 | 388.1 | 106.7 | 363.7 | -0.4 | -10.1 | 10.7 |
| අනෙකුත් ඛනිජ තෙල් | 378.0 | 143.5 | 263.5 | 534.5 | 187.4 | 285.2 | 41.4 | 30.6 | 8.3 |
| රසායනික ද්‍රව්‍ය සහ සංයෝග | 191.8 | 144.2 | 133.0 | 206.9 | 154.4 | 134.0 | 7.9 | 7.1 | 0.7 |
| තිරිඟු සහ ධාන්‍ය | 144.1 | 152.1 | 94.8 | 169.8 | 120.6 | 140.7 | 17.8 | -20.7 | 48.5 |
| රෙදිපිළි | 111.5 | 133.7 | 83.4 | 117.7 | 138.7 | 84.8 | 5.6 | 3.7 | 1.7 |
| ප්ලාස්ටික් | 225.4 | 172.3 | 130.8 | 249.9 | 184.5 | 135.4 | 10.8 | 7.1 | 3.5 |
| දියමන්ති | 193.2 | 116.6 | 165.8 | 172.6 | 103.4 | 167.0 | -10.7 | -11.3 | 0.7 |
| වෙනත් | 205.0 | 202.7 | 101.1 | 197.4 | 195.9 | 100.8 | -3.7 | -3.3 | -0.4 |
| **ආයෝජන භාණ්ඩ** | **169.3** | **195.0** | **86.8** | **202.5** | **227.6** | **89.0** | **19.6** | **16.7** | **2.5** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 201.0 | 197.3 | 101.9 | 287.2 | 259.9 | 110.5 | 42.8 | 31.7 | 8.5 |
| ප්‍රවාහන උපකරණ | 175.2 | 101.3 | 173.0 | 175.2 | 100.9 | 173.6 | 0.0 | -0.3 | 0.3 |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 143.3 | 230.3 | 62.2 | 167.7 | 259.6 | 64.6 | 17.0 | 12.7 | 3.8 |
| වෙනත් | 261.8 | 123.4 | 212.3 | 285.2 | 166.6 | 171.2 | 8.9 | 35.0 | -19.3 |
| **මුළු ආනයන** | **174.8** | **163.4** | **107.0** | **192.7** | **170.1** | **113.3** | **10.2** | **4.1** | **5.9** |
| වෙළෙඳ අනුපාතය | | | 96.6 | | | 95.6 | | | -1.0 |

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

එම නිසා මෙම වරප්‍රසාද වල ප්‍රතිලාභ ක්‍රමයෙන් නැතිවී යාමට පෙර, ලැබී ඇති සහනයන් මගින් වරණීය වෙළෙඳපොළවල් තුළ තම වෙළෙඳපොළ හා භාණ්ඩ වඩාත් ඉක්මණින් තහවුරු කර ගැනීමට ක්‍රියා කිරීම ඉතා වැදගත් වේ.

**විදේශ වෙළෙඳාම දියුණු කිරීම සඳහා රජය විවිධාකාරයෙන් පහසුකම් සලසා ඇත.** ආයෝජන මණ්ඩලය (BOI), ආයෝජකයන්ට පහසුකම් සපයන කේන්ද්‍රස්ථානය ලෙස තවදුරටත් ක්‍රියා කළේය. ව්‍යාපාර හිතකාමී නීති රෙගුලාසි මෙන්ම ආකර්ෂණීය බදු විරාම (වසර 3-15), සහනදායී බදු අනුපාත, ලිහිල් විදේශ විනිමය පාලන වරප්‍රසාද, ප්‍රාග්ධන භාණ්ඩ හා අමුද්‍රව්‍ය සඳහා ආනයන තීරුබදු සහන සහ ඉපැයීම්වල ලාභාංශ හා ප්‍රාග්ධනය තම රටට යැවීමේ හැකියාව යනාදී සහනවලින් සමන්විතව, අපනයන සැකසුම් කලාප (EPZ) විශාල ප්‍රමාණයක් ඇතිකිරීම නිසා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලත් කර්මාන්තවල දායකත්වය මෑත කාලයේ මුළු අපනයනවලින් සියයට 65 කට වඩා වැඩිවිය. ශ්‍රී ලංකා අපනයන ප්‍රවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන ද විදේශ වෙළෙඳාමට සහාය දුන් අනෙකුත් ආයතන විය.


## 5.3 භාණ්ඩ වෙළෙඳම, වෙළෙඳ ශේෂය සහ වෙළෙඳ අනුපාතය

### අපනයන ක්‍රියාකාරිත්වය

**ඇතැම් මූලික අපනයන කාණ්ඩයන්හි, අපනයන මිල ගණන් සහ අපනයන පරිමාවේ ඉහළ යාම හේතුවෙන් 2007 වසරේ දී අපනයන ආදායම තවදුරටත් වර්ධනය විය.** අන්තර්ජාතික වෙළෙඳපොළේ වර්ධනය වන තරඟකාරිත්වයට මුහුණ දීම සඳහා අපනයනකරුවන් විසින් දරනු ලැබූ නිරන්තර ප්‍රයත්නයන්, ශ්‍රී ලංකාව හා එහි අනෙකුත් වෙළෙඳ පාර්ශවකරුවන් සමග ඇතිකර ගත් වෙළෙඳ ගිවිසුම් සහ අපනයන ගමනාන්ත රටවල 2007 වසරේ වැඩි කාලයක් මුළුල්ලේ පැවැති සතුටුදායී ක්‍රියාකාරීත්වය, කාර්මික අපනයන ඉහළ යාමට බෙහෙවින් ඉවහල් විය. එමෙන්ම, පෙර නොවූ අයුරින් අන්තර් ජාතික වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ඉහළ යාම වක්‍රාකාරව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අපනයනයන්ට සතුටුදායක අන්දමින් බලපාමින්, ශ්‍රී ලංකාවේ අපනයනයන් සඳහා ද වැඩි ඉල්ලුමක් ඇති කළේය. 2007 වසර තුළ අපනයන ආදායම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 7,740 ක් වූ අතර, පෙර වසර සමග සසඳන විට එය සියයට 12.5 ක සිත්ගන්නා සුළු වර්ධනයකි.

**විශේෂයෙන් ඉහළ වර්ධනයක් පෙන්වූ රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම හේතුවෙන්, 2007 දී කාර්මික අපනයනයන් සියයට 10 කින් වර්ධනය වන ලදී.** තවදුරටත් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ඉපැයීමේ ප්‍රධානතම ප්‍රභවය වන්නේ රෙදිපිළි හා ඇඟළුම් අපනයනයයි. රෙදිපිළි හා ඇඟළුම් අපනයන වර්ධනයට බෙහෙවින් දායක වී ඇත්තේ, වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ ලැබී ඇති සහනයන් හරහා යුරෝපා සංගමයේ රටවලට සිදුකරන ලද අපනයනයන්ය. 2005 සහ 2006 වසරවල යුරෝපා සංගමයේ රටවල් පිළිවෙළින් සියයට 36 ක සහ සියයට 40 ක දායකත්වයක් දැරූ අතර, 2007 වසරේ දී මුළු ඇඟළුම් අපනයනයන්ගෙන් සියයට 45 ක දායකත්වයක් ලබාදෙමින් තවදුරටත් එහි දායකත්වය වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, 2007 ඇඟළුම් අපනයනයන්ගෙන් සියයට 50 කට පමණ දායක වෙමින්, ඇමෙරිකා එක්සත් ජනපදය, තවදුරටත් ශ්‍රී ලංකාවේ ඇඟළුම් අපනයනය සඳහා විශාලතම වෙළෙඳපොළ බවට පත්වී ඇත. 2007 වසරේ මුළු ඇඟළුම් අපනයනයන්ගෙන් සියයට 25 කට දායක වෙමින් එක්සත් රාජධානිය, යුරෝපීය සංගමය තුළ ශ්‍රී ලංකාවේ ඇඟළුම් අපනයනයන් සඳහා විශාලතම වෙළෙඳපොළ ලෙස පැවැති අතර, ඉන් අනතුරුව විශාලතම වෙළෙඳපොළවල් වනුයේ මුළු ඇඟළුම් අපනයනයන්ගෙන් පිළිවෙළින් සියයට 9 ක

**5.3 රූප සටහන** භාණ්ඩ අනුව අපනයන



**5.4 සංඛ්‍යා සටහන**

**අපනයන සංයුතිය**

| කාණ්ඩය | 2006 වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | 2006 දායකත්වය % | 2007 (අ) වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | 2007 (අ) දායකත්වය % | වටිනාකමේ වෙනස (අ) එ.ජ. ඩොලර් දශලක්ෂ | වර්ධන වේගය (අ) % | වර්ධනයට වූ දායකත්වය (අ) % |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | **1,292.7** | **18.8** | **1,507.2** | **19.5** | **214.5** | **16.6** | **25.0** |
| තේ | 881.2 | 12.8 | 1,025.2 | 13.2 | 143.9 | 16.3 | 16.8 |
| රබර් | 93.1 | 1.4 | 109.4 | 1.4 | 16.3 | 17.5 | 1.9 |
| පොල් | 123.9 | 1.8 | 141.2 | 1.8 | 17.3 | 14.0 | 2.0 |
| මද නිෂ්පාදන | 52.8 | 0.8 | 60.3 | 0.8 | 7.5 | 14.1 | 0.9 |
| වෙනත් | 71.0 | 1.0 | 80.9 | 1.0 | 9.9 | 13.9 | 1.1 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 194.6 | 2.8 | 231.5 | 3.0 | 37.0 | 19.0 | 4.3 |
| **කාර්මික අපනයන** | **5,401.1** | **78.5** | **5,920.5** | **76.5** | **519.3** | **9.6** | **60.5** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 363.9 | 5.3 | 513.5 | 6.6 | 149.6 | 41.1 | 17.4 |
| රෙදිපිළි හා ඇඟළුම් | 3,080.4 | 44.8 | 3,341.7 | 43.2 | 261.3 | 8.5 | 30.5 |
| ඛනිජ නිෂ්පාදන | 188.4 | 2.7 | 168.9 | 2.2 | -19.5 | -10.4 | -2.3 |
| රබර් නිෂ්පාදන | 427.5 | 6.2 | 481.5 | 6.2 | 54.0 | 12.6 | 6.3 |
| පිඟන් නිෂ්පාදන | 47.4` | 0.7 | 47.1 | 0.6 | -0.3 | -0.7 | 0.0 |
| සම්, සංචාරක භාණ්ඩ හා සපත්තු | 40.6 | 0.6 | 23.9 | 0.3 | -16.7 | -41.2 | -2.0 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 394.3 | 5.7 | 542.2 | 7.0 | 147.9 | 37.5 | 17.2 |
| දියමන්ති හා ස්වර්ණාභරණ | 327.0 | 4.8 | 368.0 | 4.8 | 41.0 | 12.5 | 4.8 |
| වෙනත් | 531.7 | 7.7 | 433.9 | 5.6 | -97.8 | -18.4 | -11.4 |
| **ඛනිජ අපනයන** | **119.9** | **1.7** | **129.2** | **1.7** | **9.2** | **7.7** | **1.1** |
| මැණික් | 103.2 | 1.5 | 106.8 | 1.4 | 3.6 | 3.5 | 0.4 |
| වෙනත් | 16.7 | 0.2 | 22.4 | 0.3 | 5.6 | 33.8 | 0.7 |
| **වර්ග නොකළ අපනයන (ආ)** | **68.9** | **1.0** | **183.6** | **2.4** | **114.6** | **166.2** | **13.4** |
| **මුළු අපනයන (ඇ)** | **6,882.7** | **100.0** | **7740.5** | **100.0** | **857.7** | **12.5** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය** | 103.96 | | 110.62 | | | | |

(අ) තාවකාලික
(ආ) ප්‍රති අපනයන ඇතුළත් ය
(ඇ) ගලපන ලද

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් ද්‍රව්‍ය අපනයනකරුවෝ
ශ්‍රී ලංකා මහ බැංකුව
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

හා 5 ක දායකත්වයක් ලබාදුන් ඉතාලිය සහ ජර්මනියයි. ශ්‍රී ලංකාවේ ඇඟළුම් අපනයන වෙළෙඳපොළ රටවල් කිහිපයකට පමණක් කේන්ද්‍රස්ථාන වී ඇති බව මෙම සංඛ්‍යාවන් මගින් පෙනෙන අතර, ඒ අනුව කාර්මික රටවල් කිහිපයක ආර්ථික ක්‍රියාකාරීත්වයට ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රියාකාරීත්වයෙහි ඇති සංවේදීතාවය ද පෙන්නුම් කරනු ලැබේ. කාර්මික අපනයනයන්ගේ අනෙකුත් උප කාණ්ඩයන් අතුරින් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අපනයනයන් අතර ආහාර, පාන වර්ග හා දුම්කොළ, රබර් නිෂ්පාදන, දියමන්ති හා ස්වර්ණාභරණ, සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ යනාදිය ද වේ.

**කෘෂිකාර්මික අපනයන අතරින් විශාලතම අපනයන ප්‍රභවය වන තේ සඳහා 2007 තවත් සතුටුදායක වසරක් විය.** 2007 වසරේ දී ශ්‍රී ලංකාවේ තේ අපනයන ඉපැයීම් ඉතිහාසයේ ප්‍රථම වරට, එ.ජ.ඩොලර් බිලියන 1 ක සීමාව ඉක්මවා යන ලදී. තේ අපනයන ආදායම දෙගුණයක් වීම සඳහා ආසන්න වශයෙන් වසර 17 ක් පමණ ගතවී ඇත. වැටුප් වැඩිකිරීම සඳහා වූ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග, නියඟය හේතුවෙන් පොහොර යෙදීමට ප්‍රමාදවීම සහ ශීඝ්‍ර ලෙස පොහොර මිල ඉහළයාම ආදී කරුණුවල ප්‍රතිඵලයක් ලෙස තේ නිෂ්පාදිතයේ පසුබෑමක් දක්නට ලැබුණු නමුත්, පහත් බිම් තේ සඳහා මැද පෙරදිග සහ ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වලින් වූ ඉතා ඉහළ ඉල්ලුම, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේවල සාමාන්‍ය මිල තවදුරටත් ඉහළ දැමීමට සමත් විය. 2007 වසරේ තේ අපනයන සැලකූ විට ශ්‍රී ලංකාවේ තේ අපනයන සඳහා විශාලතම වෙළෙඳපොළවල් වූයේ දායකත්වය පිළිවෙළින් සියයට 24 ක් සහ සියයට 50 ක් ලබාදුන් මැදපෙරදිග සහ ස්වාධීන පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල්ය. තෙල් මිල ඉහළයාමට සමගාමීව මෙම රටවල ආදායම ඉහළයාම සහ ශ්‍රී ලාංකීය තේ සතුව පවතින විශේෂිත ගුණාංග මෙම රටවලින් පවතින ඉතා ඉහළ ඉල්ලුමට හේතු විය. තේ නිෂ්පාදනය සම්බන්ධ වෘත්තීය සමිති ක්‍රියාකාරීත්වය තව දුරටත්

නොවිසඳුනු කරුණක්ව පවතින අතර, මේ නිසා තේ නිෂ්පාදනය කරන සමාගම්වල දීර්ඝ කාලීන පැවැත්මට මෙන්ම, අන්තර් ජාතික වෙළෙඳපොළේ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන තේ සඳහා වන තරගකාරීත්වයට බලපෑමක් ඇතිවිය හැකිය. අන්තර්ජාතික වෙළෙඳපොළේ බොරතෙල් මිල ඉහළ යාම සමගම කෘත්‍රිම රබර් මිල ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස, ස්වභාවික රබර් මිලද ඉහළයාමත් සමඟ, 2007 වසරේ දී රබර් අපනයනය තවදුරටත් වර්ධනය විය. අන්තර්ජාතික වශයෙන් ජීව ඉන්ධන නිෂ්පාදනයට පොල් තෙල් යොදාගැනීම නිසා, 2007 වසරේ දී පොල් සහ පොල් නිෂ්පාදන අපනයනවල මිල ගණන් ඉහල ගියේය. එසේවුවද දේශීය වෙළෙඳපොළේ පොල් මිල ඉහල යාම නිසා 2007 වසර අගදී පොල් සහ පොල් නිෂ්පාදන අපනයනය කිරීම නීතියෙන් තහනම් කරන ලදී. මෙය 2007 වසරේ දී පොල් අපනයනයේ පසුබෑස්මකට හේතුවක් විය.


## ආනයන ක්‍රියාකාරිත්වය

**පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම අඩු වේගයකින් ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස, 2007 වසරේ වැඩි කාලයක් තුළදී ආනයන වියදම සාපේක්ෂ වශයෙන් අඩු වර්ධන වේගයක් වාර්තා කළේය.** කෙසේ වෙතත්, විශේෂයෙන් ඛනිජ තෙල් මෙන්ම ආයෝජන භාණ්ඩ ආනයන වියදමෙහි සිදු වූ සැලකිය යුතු ඉහළයාම හේතුවෙන් පසුගිය වර්ෂය සමග සසඳන විට 2007 වසර අවසානයේ දී ආනයන වියදම සියයට 10.2 ක වර්ධනයක් වාර්තා කරන ලදී. 2007 වසරේ අග දී ජාත්‍යන්තර තෙල් මිල වාර්තාගත ලෙස ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස, පෙර වර්ෂය හා සසඳන විට, 2007 වසරේ ආනයන වියදම ඉහළ යාම සඳහා ඛනිජ තෙල් ආනයනය සියයට 40 ක දායකත්වයක් සපයන ලදී. 2006 වසරේ දෙසැම්බර් මස දී එ. ජ. ඩොලර් 59.85 ක් වූ බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල 2007 වසරේ දෙසැම්බර් මස වන විට එ.ජ. ඩොලර් 90 කට වඩා ඉහළ යන ලදී. අනෙකුත් අතරමැදි භාණ්ඩ වන පොහොර, රෙදිපිළි සහ ඇඟළුම් සහ රසායනික ද්‍රව්‍ය සඳහා ද 2007 වසරේ දී වඩා ඉහළ ආනයන වියදමක් දරණ ලදී.

**2007 වසරේ දී ශ්‍රී ලංකාවේ ආනයන ක්ෂේත්‍රයේ වූ යහපත් වර්ධනයක් ලෙස, ආයෝජන භාණ්ඩ වියදම සියයට 19.6 කින් වර්ධනය වීම දැක්විය හැකි අතර එය ඉදිරි ආර්ථික කටයුතු වර්ධනය වීමේ පෙරනිමිත්තෙකි.** ආයෝජන භාණ්ඩ ආනයන වියදම ප්‍රසාරණය වීම සඳහා රජය විසින් දියත් කළ කඩිනම් සංවර්ධන ව්‍යාපෘති විශාල වශයෙන් බලපෑ අතර, ඉදිකිරීම්, සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණික යන අංශවල පෞද්ගලික අංශයේ ව්‍යාපෘතීන් ද මේ සඳහා දායක විය. ආයෝජන භාණ්ඩ සඳහා වන ඉල්ලුම තවදුරටත් ශක්තිමත්ව පවතිනු ඇති බවට අපේක්ෂා කරන අතර, එය ඉදිරි වසරවල දී ආනයන ක්‍රියාකාරිත්වය සඳහා වැදගත් සාධකයක් වනු ඇත.

**2007 වසරේ පාරිභෝගික භාණ්ඩ සඳහා වූ වියදම වර්ධනය වීම සඳහා මුළුමනින්ම මෙන් හේතුවූයේ ආහාර හා පාන උප කාණ්ඩයයි.** 2007 වසරේ දී ප්‍රධාන ආහාර කාණ්ඩ කිහිපයකම ජාත්‍යන්තර මිල ගණන් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සඳහා සියයට 50 ක දායකත්වයක් සපයමින් ආහාර හා පාන ආනයන වියදම සියයට 11.4 කින් ඉහළ ගියේය. කාළගුණය හා සම්බන්ධ බලපෑම්, අස්වැන්න අඩුවීම සහ ප්‍රධාන නිෂ්පාදිත රටවල තොග පහළ යාම මෙන්ම නැගී එන රටවල ජීවන තත්ත්වය ඉහළ යාම යන සාධක ජාත්‍යන්තර භාණ්ඩ වෙළෙඳපොළෙහි මෙම භාණ්ඩවල මිල ගණන් ඉහළ යාම සඳහා හේතු විය. ආනයන ප්‍රමාණය අඩු වුව ද, ඉහළ මිල ගණන් තිරිඟු පිටි ආනයන වියදම වැඩිවීමට හේතු විය. ඒ සමගම, 2007 වසරේ සහල් ආනයනය ද තියුණු ලෙස ඉහළ ගියේය. දේශීය වෙළෙඳපොළේ සහල් මිල ගණන් ඉහළයාම පාලනය කිරීමේ තාවකාලික උපක්‍රමයක් ලෙස, 2007 වසරේ ඔක්තෝබර් මැද භාගයේ සිට දෙසැම්බර් අග දක්වා සහල් ආනයන සම්බන්ධයෙන් පැවති බදු ඉවත්

**5.4 රූප සටහන** — **භාණ්ඩ අනුව ආනයන**



**5.5 සංඛ්‍යා සටහන**

## ආනයන සංයුතිය

| කාණ්ඩය | 2006 | | 2007 (අ) | | වටිනාකමේ වෙනස (අ) එ.ජ. ඩොලර් දශලක්ෂ | වර්ධන වේගය (අ) % | වර්ධනයට වූ දායකත්වය (අ) % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | දායකත්වය % | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **1,980.2** | **19.3** | **2,001.8** | **17.7** | **21.6** | **1.1** | **2.1** |
| ආහාර හා පාන වර්ග | 956.0 | 9.3 | 1,064.8 | 9.4 | 108.8 | 11.4 | 10.4 |
| සහල් | 5.5 | 0.1 | 38.7 | 0.3 | 33.2 | 599.9 | 3.2 |
| සීනි | 223.7 | 2.2 | 154.1 | 1.4 | -69.6 | -31.1 | -6.6 |
| තිරිඟු | 198.6 | 1.9 | 233.9 | 2.1 | 35.3 | 17.8 | 3.4 |
| වෙනත් | 528.2 | 5.2 | 638.0 | 5.6 | 109.8 | 20.8 | 10.5 |
| වෙනත් පාරිභෝගික භාණ්ඩ | 1,024.2 | 10.0 | 937.1 | 8.3 | -87.1 | -8.5 | -8.3 |
| **අන්තර් භාණ්ඩ** | **5,962.4** | **58.2** | **6,513.4** | **57.6** | **551.0** | **9.2** | **52.6** |
| ඛනිජ තෙල් | 2,070.4 | 20.2 | 2,496.8 | 22.1 | 426.4 | 20.6 | 40.7 |
| පොහොර | 164.1 | 1.6 | 192.5 | 1.7 | 28.5 | 17.3 | 2.7 |
| රසායනික ද්‍රව්‍ය | 260.8 | 2.5 | 281.4 | 2.5 | 20.6 | 7.9 | 2.0 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1,546.2 | 15.1 | 1,632.2 | 14.4 | 86.0 | 5.6 | 8.2 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 1,921.0 | 18.7 | 1,910.5 | 16.9 | -10.5 | -0.5 | -1.0 |
| **ආයෝජන භාණ්ඩ** | **2,245.7** | **21.9** | **2,685.2** | **23.8** | **439.5** | **19.6** | **42.0** |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 1,065.4 | 10.4 | 1,246.7 | 11.0 | 181.3 | 17.0 | 17.3 |
| ගමනාගමන උපකරණ | 364.5 | 3.6 | 364.5 | 3.2 | 0.0 | 0.0 | 0.0 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 546.2 | 5.3 | 780.3 | 6.9 | 234.1 | 42.9 | 22.4 |
| වෙනත් | 269.6 | 2.6 | 293.6 | 2.6 | 24.1 | 8.9 | 2.3 |
| **වර්ග නොකළ ආනයන** | **65.4** | **0.6** | **100.2** | **0.9** | **34.8** | **53.2** | **3.3** |
| **මුළු ආනයන (ආ)** | **10,253.7** | **100.0** | **11,300.5** | **100** | **1,046.8** | **10.2** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය** | **103.96** | | **110.62** | | | | |

(අ) තාවකාලික
(ආ) ගලපන ලද

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ශ්‍රී ලංකා මහ බැංකුව
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම

කිරීම මීට හේතු විය. කල්පවතින පාරිභෝගික භාණ්ඩ ආනයනය ගත් විට, මෝටර් රථ හා යතුරුපැදි ආනයන වියදම අඩු වූ අතර, ඒ සඳහා 2007 වසරේ මෝටර් රථ ආනයන සඳහා පැවති ඉහළ සඵල බදු අනුපාතික හේතු වන්නට ඇත.

**ආනයන වර්ධනය අභිබවා ගිය අපනයන වර්ධනය 2007 වසර තුළ දී වෙළෙඳ හිඟය පුළුල් වීම සීමා කිරීමට උපකාරී විය.** 2006 වසරේ දී සියයට 34 ක වේගයකින් වර්ධනය වූ වෙළෙඳ හිඟය 2007 වසරේ දී වර්ධනය වූයේ සියයට 5.6 ක් වැනි සාමාන්‍ය අගයකිනි. 2006 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,371 වූ සමස්ත වෙළෙඳ හිඟය 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,560 දක්වා වැඩි විය.

**2007 වසරේ දී ද වෙළෙඳ අනුපාතය පිරිහීමට ලක්විය.** කෙසේ වෙතත්, කෘෂිකාර්මික අපනයන සඳහා වූ යහපත් මිල ගණන් එම පිරිහීමෙහි අයහපත් ප්‍රතිඵල අවම කිරීමට දායක විය. තෙල් මිල සීඝ්‍රයෙන් ඉහළ යාම හා ලෝක ආහාර වෙළෙඳපොළෙහි සැපයුම් හිඟතාවයන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික අපනයන සඳහා චක්‍රාකාරව යහපත් ලෙස බලපාන ලදී. ශ්‍රී ලංකාව විසින් අපනයනය කරන ලද තේවල සාමාන්‍ය මාසික මිල, 2007 වසරේ දෙසැම්බර් මස දී තේ කිලෝ එකක් සඳහා එ.ජ.ඩොලර් 3.78 ක් වූ අතර එය මෙතෙක් පැවති ඉහළම සාමාන්‍ය මාසික මිල වේ. 2007 වසරේ දී ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේ කිලෝ එකක සාමාන්‍ය මිල එ.ජ. ඩොලර් 3.28 වූ අතර 2006 වසරේ දී තේ කිලෝ එකක සාමාන්‍ය මිල එ.ජ. ඩොලර් 2.69 විය. ඒ හා සමානව 2006 වසරේ දී කිලෝග්‍රෑම් එකකට එ.ජ.ඩොලර් 1.99 වූ රබර්වල සාමාන්‍ය අපනයන මිල 2007 වසරේ දී කිලෝග්‍රෑම් එකකට එ.ජ.ඩොලර් 2.13 වූ අතර, එය 2007 වසර අගවන විට තව දුරටත් ඉහළ යන ලදී. මෙයට යම්තාක් දුරකට හේතු වූ කරුණු වන්නේ ඓතිහාසිකව ඉහළ ගිය තෙල් මිල සහ කෙටිකාලීන සැපයුම් හිඟතාවයන්ය. චීනය සහ අනෙකුත් රටවල අපනයන වැඩිවීමත් සමග වෙළෙඳපොළේ පැවැති බලපෑම් නිසා, 2007 වසරේ දී රෙදිපිළි මිල ගණන් මඳ වශයෙන් පමණක් ඉහළ ගිය අතර නුදුරු කාලයේ දී ද මිල ගණන්වල යහපත් වැඩිවීමක් දක්නට නොහැකි වනු ඇත. රබර් සහ අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන වන කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි සහ දුම්කොළවල අපනයන මිල ගණන් ද 2007 වසරේ දී ඉහළ යන ලදී. ආනයන සම්බන්ධයෙන් ගත් විට ප්‍රධාන වශයෙන් ඕස්ට්‍රේලියාව වැනි නිෂ්පාදිත රටවල පැවති නියඟය හේතුවෙන් ඇති වූ සැපයුම් හිඟතාවයන් හේතුවෙන්, 2007 වසරේ දී ජාත්‍යන්තර වෙළෙඳපොළේ ධාන්‍ය

**5.6 සංඛ්‍යා සටහන** **ප්‍රධාන ආනයනයන්හි පරිමාවන් (අ)**

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2003 | 2004 | 2005 (ආ) | 2006 | 2007 (ඇ) |
|---|---|---|---|---|---|
| **සහල්** | **35** | **222** | **52** | **12** | **88** |
| 1 වන කාර්තුව | 22 | 9 | 43 | 3 | 4 |
| 2 වන කාර්තුව | 9 | 9 | 4 | 2 | 7 |
| 3 වන කාර්තුව | 2 | 4 | 2 | 3 | 3 |
| 4 වන කාර්තුව | 2 | 200 | 3 | 4 | 74 |
| **තිරිඟු** | **919** | **993** | **864** | **1,200** | **952** |
| 1 වන කාර්තුව | 262 | 257 | 272 | 287 | 204 |
| 2 වන කාර්තුව | 232 | 218 | 191 | 321 | 388 |
| 3 වන කාර්තුව | 217 | 189 | 174 | 331 | 274 |
| 4 වන කාර්තුව | 208 | 329 | 227 | 261 | 87 |
| **සීනි** | **509** | **438** | **418** | **525** | **481** |
| 1 වන කාර්තුව | 151 | 98 | 49 | 112 | 112 |
| 2 වන කාර්තුව | 135 | 173 | 167 | 137 | 138 |
| 3 වන කාර්තුව | 104 | 71 | 94 | 127 | 118 |
| 4 වන කාර්තුව | 119 | 96 | 108 | 149 | 113 |
| **ඛනිජ තෙල් (බොර තෙල්)** | **1,995** | **2,200** | **2,008** | **2,151** | **1,938** |
| 1 වන කාර්තුව | 382 | 586 | 586 | 592 | 272 |
| 2 වන කාර්තුව | 466 | 464 | 581 | 535 | 557 |
| 3 වන කාර්තුව | 500 | 634 | 246 | 582 | 559 |
| 4 වන කාර්තුව | 647 | 516 | 595 | 442 | 550 |
| **පිරිපහදු ඛනිජ තෙල්** | **1,168** | **1,645** | **1,823** | **1,763** | **2,297** |
| 1 වන කාර්තුව | 340 | 460 | 314 | 402 | 489 |
| 2 වන කාර්තුව | 239 | 380 | 396 | 468 | 527 |
| 3 වන කාර්තුව | 317 | 341 | 711 | 334 | 736 |
| 4 වන කාර්තුව | 272 | 464 | 402 | 559 | 545 |
| **පොහොර** | **514** | **510** | **529** | **633** | **569** |
| 1 වන කාර්තුව | 124 | 54 | 168 | 166 | 62 |
| 2 වන කාර්තුව | 166 | 164 | 111 | 203 | 171 |
| 3 වන කාර්තුව | 49 | 76 | 142 | 119 | 132 |
| 4 වන කාර්තුව | 175 | 216 | 107 | 146 | 205 |

(අ) ගලපන ලද
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම

මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. ප්‍රධාන වශයෙන් සත්ව ආහාර සඳහා වියදම් වැඩි වීම, දියුණු වෙමින් පවතින රටවල ඉහළ ආනයනික ඉල්ලුම සහ සැපයුම් හිඟතාවයන්හි ප්‍රතිඵලයක් ලෙස කිරි නිෂ්පාදිතවල ජාත්‍යන්තර මිල ගණන් ද ඉහළ ගියේය. තිරිඟු පිටි සහ කිරි නිෂ්පාදිතවල මිල ගණන් 2007 වසර තුළ දී, වාර්තාගත ඉහළ මට්ටම් කරා ළඟා විය. එසේම, ප්‍රධාන සහල් නිෂ්පාදන රටවල පැවති සැපයුම් ඌණතාවයන් හේතුවෙන් සහල් මිලගණන් ද ඉහළ යන ලදී. ඉහත සඳහන් කරන ලද ප්‍රවණතාවයනට ප්‍රතිවිරුද්ධව, 2004 වසරේ මුල භාගයේ සිට සැලකිය යුතු ලෙස ඉහළ ගොස් 2006 වසරේ අවසාන කාර්තුවෙහි යම් ප්‍රමාණයකට පහළ ගිය සීනිවල ජාත්‍යන්තර මිල ගණන්, 2007 වසරේ දී පැවති නිෂ්පාදිත අතිරික්තයන් හේතුවෙන් තවදුරටත් පහළ යන ලදී.


ආහාර සහ කෘෂිකාර්මික සංවිධානය (FAO) පෙන්වා දෙන ආකාරයට කාලගුණය හා සම්බන්ධ සාධක, කෙටි කාලීනව හා මැදි කාලීනව, ධාන්‍ය සහ කිරි නිෂ්පාදිත මිල ගණන් ඉහළ යාමට බලපෑ ඇති අතර මෙම ආහාර මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යාම සඳහා අනෙකුත් දිගු කාලීනව බලපෑ හැකි සාධක ද දායක වී ඇත. ජීව ඉන්ධන නිෂ්පාදනය සඳහා ඉරිඟු වැනි ධාන්‍ය වර්ග මෙන්ම, සීනි සහ ආහාර පිසීමට ගන්නා තෙල් වර්ගද වැඩි වශයෙන් යොදා ගැනීම ද, මෙම සාධක අතර වේ. සංවර්ධනය වෙමින් පවතින සහ නැගී එන ආර්ථිකයන්හි පාරිභෝජන ඉල්ලුම ඉහළයාම, ජාත්‍යන්තර ආහාර මිල ගණන් ඉහළ යාම කෙරෙහි බලපාන තවත් වැදගත් සාධකයක් වේ.

ඉහත සඳහන් කරන ලද සංවර්ධනයන්වල ප්‍රතිඵලයක් ලෙස 2007 වසරේ දී අපනයන මිලගණන් සියයට 4.2 කින් ඉහළ ගිය අතර, ආනයන මිල ගණන් සියයට 8.0 කින් ඉහළ යන ලදී. 2007 වසරේ දී අපනයන ඒකක වටිනාකම් දර්ශකය ඉක්මවා ගිය ආනයන වටිනාකම් දර්ශකය හේතුවෙන් වෙළෙඳ අනුපාතිකය සියයට 1.0 කින් සුළු වශයෙන් පිරිහීමට ලක්විය.


## වෙළෙඳ දිශාව

ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳපොළ සංකේන්ද්‍රණය 2007 වසරේදී තව දුරටත් අඩු වූ නමුත්, අපනයනවලින් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් තවදුරටත් බටහිර රටවල් කිහිපයක් වෙත යොමු වේ. රෙදිපිළි හා ඇඟළුම් සඳහා ප්‍රධාන වෙළෙඳපොළවල් වන ඇමෙරිකා එක්සත් ජනපදය (සියයට 25), එක්සත් රාජධානිය (සියයට 13), ජර්මනිය (සියයට 6) සහ ඉතාලිය (සියයට 5) මෙන්ම ශ්‍රී ලංකාවෙන් අපනයනය කළ කැපූ දියමන්ති සඳහා විශාලතම වෙළෙඳපොළ වන බෙල්ජියම (සියයට 5) ද මේ අතර වේ. ජාත්‍යන්තර ඇඟළුම් වෙළෙඳපොළේ තියුණු තරඟකාරිත්වය නිසා ශ්‍රී ලංකාවේ මුළු අපනයන සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ දායකත්වය, 2007 වසරේ දී ද පහළ ගිය ද, ඇමෙරිකා එක්සත් ජනපදය තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන ගමනාන්තය

**5.5 රූප සටහන** **වෙළෙඳ අනුපාතය සහ අපනයන සහ ආනයන දර්ශක: පරිමාව සහ ඒකක මිල**




**5.6 රූප සටහන** **අපනයන වෙළඳ දිශාව**




විය. ඉන්දු-ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක වීමත් සමග ඉන්දියාව, ශ්‍රී ලංකාවට වැදගත්වන අපනයන වෙළෙඳපොළක් බවට පත් වූ අතර, 2007 වසරේ දී ඉන්දියාව මුළු අපනයනවලින් සියයට 7 කට පමණ දායක විය. ඉන්දියාවට යැවූ අපනයනවලින් ප්‍රධානතම ද්‍රව්‍යයක් වූයේ වනස්පති ලෙස හැඳින්වන එළවළු තෙල් විශේෂයක් වන අතර, එය 2007 හි ඉන්දියාවට වූ මුළු අපනයනවලින් සියයට 20 ක් පමණ විය. තේ අපනයන සඳහා ප්‍රධානතම වෙළෙඳපොළවල් වන රුසියාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවල් මුළු අපනයනවලින් සියයට 3 බැගින් වූ දායකත්වයක් දැක්වූ අතර, තේ සඳහා තවත් වැදගත් වෙළෙඳපොළක් වන ඉරානය මුළු අපනයනවලින් සියයට 1.5 කට දායක විය. ප්‍රංශය, ජපානය හා නෙදර්ලන්තය සියයට 2 බැගින් දායක වූ අතර අනෙකුත් රටවල් මුළු අපනයනවලින් සියයට 1 ක් හෝ ඊට අඩු ප්‍රමාණයකින් දායක විය.

ඉන්දියාව තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම ආනයන ප්‍රභවය වූ අතර, 2007 වසරේ දී, ආසියානු රටවල් තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම ආනයන සැපයුම්කරුවන් විය. ඉන්දියාවෙන් ඛනිජ තෙල් මෙන්ම රථවාහන වැනි කල් පවතින පාරිභෝගික භාණ්ඩ ද, සීනි, සහල්, ළූණු සහ සිමෙන්ති වැනි වෙනත් පාරිභෝගික භාණ්ඩ ද ආනයනය කිරීම හේතුකොට ගෙන, එහි ආනයන දායකත්වය සියයට 23 ක් දක්වා වර්ධනය විය. සිංගප්පූරුව (සියයට 10), චීනය (සියයට 8), ඉරානය (සියයට 7), හොංකොං (සියයට 6), ජපානය (සියයට 4), එක්සත් අරාබි එමීර් රාජ්‍යය (සියයට 3) සහ මැලේසියාව (සියයට 3) අනෙකුත් ප්‍රධාන ආසියාතික ආනයන ප්‍රභව විය. ඇමෙරිකා එක්සත් ජනපදය 2007 දී මුළු ආනයනවලින් සියයට 4 කට දායක විය. ඉහත සඳහන් රටවල් සියල්ලම මුළු ආනයනවලින් සියයට 68 කට පමණ දායක වූ අතර, සෙසු රටවලින් කළ ආනයන වෙන් වෙන්ව ගත් විට මුළු ආනයන වියදමින් සියයට 2 ක් හෝ ඊට අඩු අගයක් විය.

**5.7 රූප සටහන** **ආනයන වෙළෙඳ දිශාව**



## 5.4 සේවා වෙළෙඳාම, ආදායම්, සංක්‍රාම සහ ජංගම ගිණුමේ ශේෂය

### ප්‍රවාහන සේවා වෙළෙඳාම

**නැව් කුලී, වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ මගී ගාස්තුවලින් සමන්විත දළ ප්‍රවාහන සේවා ඉපැයීම් 2007 වසර තුළ දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 840 දක්වා සියයට 11.9 කින් ඉහළ ගියේය.** නැව්ගත භාණ්ඩ ධාරිතාවය ඉහළයාම හේතුවෙන් වරාය ආශ්‍රිත කටයුතු සැලකිය යුතු ලෙස වර්ධනය වීම, ජාතික ගුවන් සේවාවේ ගුවන් ගමනාන්ත පුළුල් කිරීම, ගුවන් පැය ගණන සහ ගුවන් ගමන් වාර ගණන වැඩි කිරීම සහ මිහින් ලංකා නමින් නව ගුවන් සේවාවක් ආරම්භ කිරීම මත මගී ගාස්තු ආදායම් ඉහළ යාම හේතුවෙන් ප්‍රවාහන සේවා ලැබීම් ඉහළ ගියේය. ආරක්ෂක හේතූන් මත වසරේ මාස කිහිපයක් තුළ විදේශ ගුවන් සේවා කිහිපයක් සිය මෙහෙයුම් කටයුතු අත්හිටුවීම හේතුකොටගෙන ගුවන් මගී ප්‍රවාහනය සඳහා ජාතික ගුවන් සේවාවන්ට වැඩි අවස්ථාවක් හිමිවිය. විශේෂයෙන්ම සියයට 10.6 කින් බහාලුම් ප්‍රතිනැව්ගත කිරීම්හි ඇති වූ සැලකිය යුතු වර්ධනයත් සමග කොළඹ වරායේ බහාලුම් මෙහෙයවීම් වර්ධනය වීම නිසා වරාය ආශ්‍රිත කටයුතුවලින් ඉපැයීම් ඉහළ ගියේය. කොළඹ වරායේ සේවා සැපයීම් වර්ධනය, ඉන්දියාවේ ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු පුළුල් වීම සහ අඛණ්ඩ ඉහළ ආර්ථික වර්ධනය හේතුකොට ගෙන බහාලුම් ප්‍රතිනැව්ගත කිරීම් ඉහළ ගියේය. කලාපයේ තරගකාරී වරායන්ගෙන් එල්ලවිය හැකි අනාගත අභියෝග ජයගැනීමට සහ වරාය ආශ්‍රිත කටයුතුවල වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා කොළඹ දක්ෂිණ වරාය ව්‍යාපෘති වැනි හඳුනාගත් වරාය සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය පිරිවැය ඉහළයාමට, කොළඹ වරායේ සිට අනිකුත් තරගකාරී වරායන්ට ව්‍යාපාර මාරුවීමට සහ ඒ තුළින් වරාය ආශ්‍රිත කටයුතුවලින් අනාගත ඉපැයීම් හැකියාව හීනවීමට හේතුවනු ඇත. මේ අතර, ඉහළ ආනයන වර්ධනය මෙන්ම විනෝදය, රැකියා, අධ්‍යාපනය හා සෞඛ්‍ය කටයුතු සඳහා විදේශගතවන ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් ප්‍රවාහන සේවා ගෙවීම් ද, සියයට 10.6 කින් වර්ධනය විය. ඇතැම් කලාපීය රටවලට සමහර ගුවන් සේවා විසින් පිරිනැමූ තරගකාරී ගුවන් ගමන් පැකේජ, ශ්‍රී ලාංකිකයන් විදේශ සංචාරයේ යෙදීම ඉහළයාම සඳහා දැඩි ලෙස බලපා ඇත.

### විදේශ ගමන් සහ සංචාරක සේවා

**2007 වසර තුළ දී සංචාරක කර්මාන්තයේ පසුබෑමක් වාර්තා විය.** 2006 වසරේ දී 559,603 ක් වූ සංචාරක පැමිණීම්, 2007 වසරේ දී 494,008 දක්වා සියයට 11.7 කින් පහළ ගියේය. එක්සත් රාජධානිය, ජර්මනිය, ඔස්ට්‍රේලියාව, ඉතාලිය, සහ ප්‍රංශය යන සංචාරකයින් පැමිණෙන ප්‍රධාන රටවල් විසින් නිකුත් කරන ලද අහිතකර සංචාරක උපදේශයන් සංචාරක කර්මාන්තයේ වර්ධනයට අහිතකර ලෙස බලපෑවේය. අයහපත් ආරක්ෂක තත්ත්වය සහ මෙම අහිතකර සංචාරක උපදේශයන් හේතුවෙන් එක්සත් ජනපදය, මාලදිවයින සහ රුසියාව හැර අනෙකුත් සියලුම ප්‍රධාන සංචාරකයන් පැමිණෙන රටවලින්, සංචාරක පැමිණීම් අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2006 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 410 ක් වූ සංචාරක ඉපැයීම් 2007 වසරේ දී, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 385 දක්වා අඩු විය. කෙසේ වෙතත් 2007 වසර තුළ දී සංචාරක ව්‍යාපාරයේ උන්නතිය වෙනුවෙන් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. කර්මාන්තයට සහාය වීම සඳහා සහනදායී ක්‍රියාමාර්ග ගත් අතර, ඒවා අතර 2006 වසරේ දී අයවැය මගින් පනවන ලද එ.ජ.ඩොලර් 10 ක වීසා ගාස්තුව කල් දැමීමට රජය අනුමැතිය දීම, සංචාරක කටයුතු සඳහා එකතුකළ අගය මත බදු ගෙවීම තාවකාලිකව අත්හිටුවීම, කල්පසු වූ එකතු කළ අගය මත බදු ගෙවීම වෙනුවෙන් වූ දඩ මුදල් නතර කිරීම සහ ප්‍රාග්ධන ගෙවීම් සඳහා සහනයක් ලබා දීම වැනි සහන ඇතුළත් වේ. 2007 වසරේ සිදු වූ ඉතා වැදගත්ම සිදුවීමක්

**5.7 සංඛ්‍යා සටහන** — **ශුද්ධ සේවා, ආදායම් සහ සංක්‍රාම (අ)**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් දශ ලක්ෂ | | රුපියල් දශ ලක්ෂ | |
|---|---|---|---|---|
| | 2006 | 2007(ආ) | 2006 | 2007(ආ) |
| 1. ප්‍රවාහනය | 211 | 243 | 21,885 | 26,863 |
| 2. සංචාරක | 37 | -8 | 3,836 | -851 |
| 3. විදුලි සංදේශ සේවා | 19 | 18 | 1,959 | 1,984 |
| 4. පරිගණක සහ තොරතුරු සේවා | 98 | 110 | 10,188 | 12,169 |
| 5. ඉදිකිරීම් සේවා | 24 | 27 | 2,456 | 3,015 |
| 6. රක්ෂණ සේවා | 20 | 15 | 2,081 | 1,681 |
| 7. වෙනත් ව්‍යාපාරික සේවා | -138 | -153 | -14,297 | -17,029 |
| 8. රජයේ වියදම් (අන් තැනක සඳහන් නොවන) | -14 | -14 | -1,448 | -1,531 |
| **මුළු සේවා** | **257** | **239** | **26,660** | **26,301** |
| 1. සේවක වන්දි ගෙවීම | -11 | -11 | -1,138 | -1,240 |
| 2. සෘජු ආයෝජන ආදායම් | -360 | -346 | -37,413 | -38,267 |
| 3. පොලී සහ අනෙකුත් ගෙවීම් | -18 | -1 | -1,873 | 485 |
| **මුළු ආදායම** | **-389** | **-358** | **-40,424** | **-39,041** |
| 1. පෞද්ගලික | 1,904 | 2,214 | 197,861 | 245,006 |
| 2. මධ්‍යම ආණ්ඩුව | 101 | 97 | 10,524 | 10,677 |
| **මුළු ජංගම සංක්‍රාම** | **2,004** | **2,311** | **208,385** | **255,684** |

(අ) මෙම ඉදිරිපත් කිරීම ගෙවුම් තුලන අත්පොතෙහි 5 වන සංශෝධනය (1993)ට අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන ආකාරයට සැසඳෙන ලෙස ඉදිරිපත් කර ඇත.

(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.8 සංඛ්‍යා සටහන

**සංචාරක ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2003 | 2004 | 2005 | 2006(අ) | 2007(ආ) | වර්ධන වේගය 2006(අ) | වර්ධන වේගය 2007 (ආ) |
|---|---|---|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් | 500,642 | 566,202 | 549,308 | 559,603 | 494,008 | 1.9 | -11.7 |
| 2. සංචාරක රාත්‍රී ගණන (දහස්) | 5,093 | 5,742 | 4,754 | 5,793 | 4,940 | 21.9 | -14.7 |
| 3. කාමර උපයෝජන අනුපාතය (%) | 53.2 | 59.3 | 45.4 | 47.8 | 46.2 | 5.3 | -3.3 |
| 4. දළ සංචාරක ලැබීම් (රු. දශ ලක්ෂ) | 32,810 | 42,059 | 36,377 | 42,586 | 42,571 | 17.1 | 0.0 |
| 5. ඒක පුද්ගල සංචාරක ලැබීම් | 65,536 | 74,283 | 66,223 | 76,100 | 86,175 | 14.9 | 13.2 |
| 6. මුළු සේවා නියුක්තිය | 112,226 | 129,038 | 125,004 | 133,558 | 145,239 | 6.8 | 8.7 |
| සෘජු | 46,761 | 53,766 | 52,085 | 55,649 | 60,516 | 6.8 | 8.7 |
| වක්‍ර | 65,465 | 75,272 | 72,919 | 77,909 | 84,723 | 6.8 | 8.7 |

(අ) සංශෝධිතයි
(ආ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහබැංකුව

වන්නේ, ඔක්තෝබර් මස පළමුවැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි 2005 අංක 38 දරන සංචාරක පනත හඳුන්වා දීමය. මෙම පනත හඳුන්වාදීමත් සමග සංචාරක කර්මාන්තය වර්ධනය සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය වැඩි කරමින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය පිහිටුවන ලදී. නව සංචාරක පනත තුළින් සංචාරක කර්මාන්තය කළමනාකරණය කිරීමේ දී වඩාත් ඵලදායී රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාවක් බිහිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. පෞද්ගලික අංශය, සංචාරක කර්මාන්තය තුළ ප්‍රධාන හසුරවන්නා වන බැවින් සංචාරක ප්‍රතිපත්ති සකස් කිරීමේ දී සහ විදේශීය හා දේශීය වෙළෙඳපොළ ඉලක්ක කොට සිදුකරන ප්‍රවර්ධනාත්මක කටයුතුවලදී එහි දායකත්වය වැඩිවේ යැයි අපේක්ෂා කළ හැකි අතර රජයේ සහයෝගීතාවය ලැබීමත් සමග මෙම කටයුතු වඩාත් සාර්ථකවනු ඇත. 2007 වසරේ දී සංචාරකයින් පැමිණි අරමුණු සැලකූ විට, මුළු පැමිණීම් වලින් සියයට 67 ක් නිවාඩු ගතකිරීම සඳහාද, සියයට 11 ක් ව්‍යාපාරික කටයුතු සඳහාද, සියයට 8 ක් යහළුවන් සහ ඥාතීන් හමු වීමටද, සියයට 3 ක් ආගමික සහ සංස්කෘතික කටයුතු සඳහාද, එමෙන්ම සියයට 2 ක් සම්මේලන සහ රැස්වීම් සඳහාද පැමිණ ඇත.

### විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ සේවා වෙළෙඳම

**2007 වසරේ දී විදුලි සංදේශ සේවා වලින් ලද ශුද්ධ ඉපැයීම් සියයට 4.3 කින් අඩුවිය.** කෙසේ වෙතත්, අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල භාවිතය ඉහළ යෑම, ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් වර්ධනය වීම සහ ජාත්‍යන්තර විදුලි සංදේශ කටයුතු 2003 වසරේ දී නිදහස් කිරීමෙන් පසු විදුලි සංදේශ සමාගම් අතර ඇති වූ ඉහළ තරගකාරිත්වය හේතුවෙන් ජාත්‍යන්තර ඇමතුම් ගාස්තු ලාභදායක වීම, ශ්‍රී ලාංකිකයන් ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා භාවිතය දිරිමත් කිරීමට හේතුවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2003 සිට විදුලි සංදේශ සේවා ගෙවීම් අඛණ්ඩව ඉහළ ගියේය.

**පරිගණක මෘදුකාංග සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO), දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) ඇතුළු තොරතුරු තාක්ෂණ සේවා අපනයනයන් 2007 වසරේ දී අඛණ්ඩව වර්ධනය විය.** මෙම කර්මාන්තයේ වර්ධනය ශක්තිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ යටිතල පහසුකම් වැඩි දියුණුවීම, පුහුණු ශ්‍රමය ලබාගැනීමේ හැකියාව, මිල තරගකාරිත්වය සහ විශ්වාසවන්ත හා කාර්යක්ෂම සේවා සැපයුම උපකාරී විය. 2007 වසර තුළ දී විශේෂයෙන්ම මැද පෙරදිග සහ නැගෙනහිර අප්‍රිකා කලාපයන් ඇතුළු විදේශ රටවලට මෘදුකාංග පහසුකම් සැපයීම සඳහා තොරතුරු තාක්ෂණ හා විදුලි සංදේශ කර්මාන්තයේ ක්‍රියාත්මක වන ශ්‍රී ලාංකික සමාගම් සාර්ථක ලෙස ක්‍රියාකර ඇත. ඉහළ සුදුසුකම්වලින් යුත් ගණකාධිකාරීන්, නීතිඥයන් වැනි වෘත්තිකයන් ලබාගැනීමේ හැකියාව නිසා ව්‍යාපාර ක්‍රියාවලි සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ප්‍රවර්ධනයේ දී ශ්‍රී ලංකාවට වැඩි වාසියක් හිමිවේ. තොරතුරු තාක්ෂණ කලාප බිහි කිරීම මගින් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය වී විශේෂිත හා හිතකර පරිසරයක් බිහිවීම මත ව්‍යාපාර ක්‍රියාවලි හා දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ කර්මාන්තයෙන් ශ්‍රී ලංකාවට වැඩි ප්‍රයෝජන උදාකරගත හැක.

### ආදායම් ලැබීම් සහ ගෙවීම්

**2007 වසරේ දී නිල සංචිත ආයෝජන ආදායම් ඉහළ යාම හේතුකොට ගෙන ආදායම් ගිණුමේ දළ ඉපැයීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 449 දක්වා සියයට 44 කින් පමණ කැපී පෙනෙන ලෙස ඉහළ යෑම, පුළුල් වෙමින් පැවති ආදායම් ගිණුමේ හිගය සීමාකිරීමට**

**ප්‍රධාන වශයෙන් හේතු විය.** වර්ෂය තුළ දී ඉහළ යමින් පැවති ගෝලීය පොළී අනුපාත සහ නිල සංචිත තවදුරටත් ඉහළ යෑම හේතුවෙන් 2007 වසරේ දී නිල සංචිත ආයෝජනයෙන් ලද පොළී ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 105 දක්වා සියයට 44 කින් ඉහළ ගියේය. ඊට අමතරව 2007 වසරේ දී එ.ජ.ඩොලරය අනිකුත් ප්‍රධාන මුදල් වර්ග වන යුරෝ, ස්ටර්ලින් පවුම් සහ ජපන් යෙන්වලට එරෙහිව අවප්‍රමාණය වීම හේතුවෙන්, පවතින වෙළෙඳ වටිනාකම් අනුව තක්සේරු කළ විදේශ සංචිත, එ.ජ.ඩොලර් වටිනාකම අනුව දැක්වීමේ දී සැලකිය යුතු වාසියක් අත්කරදුනි. 2007 වසරේ දී පැවති ඉහළ ගෝලීය පොළී අනුපාත හේතුකොට ගෙන, වාණිජ බැංකු ඇතුළු පෞද්ගලික අංශයේ විදේශ මූල්‍ය වත්කම්වලින් ලද ඉපැයීම් ද වර්ධනය විය. 2005 වසරේ දී සුනාමි ව්‍යසනය හේතුවෙන් ණය ගෙවීම් පමා කිරීම අවසන්වීම සහ පෙර ලබාගත් ණය එකතුවීම ඉහළ යාම හේතුවෙන් විදේශ ණය මත ගෙවනු ලබන පොළී ගෙවීම් මෙම වසර තුළ දී ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස 2007 වසරේ ආදායම් ගිණුමේ ගෙවීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 807 දක්වා සියයට 15 කින් පමණ ඉහළ ගියේය. පවතින මෙහෙයුම් තවදුරටත් පුළුල් කිරීම සඳහා රඳවාගත් ලාභ නැවත ආයෝජනය කිරීම් ද ඇතුළුව, විදේශ ආයෝජකයන්ගේ ලාභ තම රට වෙත ගෙනයෑම ද වසර තුළ දී සැලකිය යුතු අයුරින් ඉහළ ගියේය.

### ජංගම සංක්‍රාම

**2007 වසරේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව තුන්වන වසරටත් ඉතා ඉහළ වේගයකින් වර්ධනය වෙමින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,502 ට ළඟා විය.** මෙම ඉහළයාමට මූලිකවම හේතු වූයේ 2007 වසරේ දී විදේශ සේවා නියුක්තිය සඳහා පිටව යන්නන්ගේ ගණන 217,306 දක්වා සියයට 8 කින් වර්ධනය වීම, සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කුවේට් සහ කටාර් වැනි තෙල් නිපදවන රටවල ආදායම ඉහළයාම තුළින් මැද පෙරදිග කලාපයේ රටවල සාමාන්‍ය වැටුප් ඉහළයාම සහ කොරියාව, මැලේසියාව හා සිංගප්පූරුව වැනි ඉහළ වැටුප් ගෙවන රටවලට පිටව යන සේවා නියුක්තිකයන්ගේ ගණන ඉහළයාමයි. බැංකු ශාඛා මගින් මුදල් හුවමාරු කිරීමේ වාසි පිළිබඳ විදේශ සේවා නියුක්තිකයන් දැනුවත් කිරීම තුළින් ප්‍රේෂණ වැඩි කිරීමට මහ බැංකුවේ මූලිකත්වය යටතේ වාණිජ බැංකු ගනු ලැබූ නව පියවර සහ අප රටේ ශ්‍රමිකයන් වැඩියෙන් සපයන ප්‍රධාන විදේශ රටවල අමතර බැංකු කාර්යාල ඇති කිරීම වැනි කරුණු, 2007 වසරේ ප්‍රේෂණ වැඩිවීමට හේතුවී ඇත. 2007 වසරේ දී වර්ධනය වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, වෙළෙඳ ගිණුමේ හිඟයෙන් සියයට 70 ක් පමණ මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය.

### ජංගම ගිණුමේ ශේෂය


**ජංගම ගිණුමේ හිඟය 2006 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,499 ක සිට 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,369 ක් දක්වා සුළු වශයෙන් පටු විය.** ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට 2006 වසරේදී වූ සියයට 5.3 සිට 2007 වසරේදී සියයට 4.2 දක්වා අඩු විය. ජංගම ගිණුම සහ විදේශ විනිමය අනුපාත මත ඉහළ ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩ මිල ගණන් ඇතිකළ අහිතකර බලපෑම් සමනය කිරීමට සහ ජංගම ගිණුමේ හිඟය අඩු කිරීමට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වර්ධනය වීම ඉවහල් විය. පුළුල් වන ජංගම ගිණුමේ හිඟය මගින් රටෙහි ආයෝජන ඉතිරි කිරීමේ පරතරය පිළිබිඹු වන අතර, ආර්ථික වර්ධන වේගය සියයට 7-8 ක මට්ටමක පවත්වාගෙන යාමට අවශ්‍ය ආයෝජන වියදම් සඳහා විදේශීය ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීමේ අවශ්‍යතාවය ද මෙමගින් පෙන්නුම් කරයි.

## 5.5 ප්‍රාග්ධන සහ මූල්‍ය ප්‍රවාහ, සහ ගෙවුම් තුලනය

### විදේශීය සෘජු ආයෝජන

**ශ්‍රී ලංකා ආර්ථිකය මත ආයෝජකයින්ගේ නොබිඳුනු විශ්වාසය සහ රටේ පවතින ආයෝජනයට හිතකර පාලන තන්ත්‍රය සනාථ කරමින් 2007 වසරේ දී විදේශීය සෘජු ආයෝජන ලැබීම්, 2006 දී වාර්තා වූ ඉහළම විදේශීය සෘජු ආයෝජන ලැබීම් ද අභිබවා යාමට සමත් විය.** ආයෝජන මණ්ඩලයේ අනුමත සමාගම් මගින් ලබාගත් විදේශීය ණය ද ඇතුළුව දළ විදේශීය සෘජු ආයෝජන ලැබීම්, 2006 දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 604 ද අභිබවා යමින් 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 734 දක්වා ළඟා විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ආයෝජන මණ්ඩලය යටතේ වූ, විශේෂයෙන්ම සේවා අංශයේ ව්‍යාපාරවල ඉපැයීම් නැවත ආයෝජනය කිරීම ශීඝ්‍ර ලෙස ඉහළයාමයි. 2007 වසරේ දී ආයෝජන ලැබීම් ඉහළයාම සඳහා අඩු

**5.8 රූප සටහන** **මූල්‍ය ගිණුමේ ප්‍රධාන ලැබීම්**



සංවර්ධිත කලාපයන්හි ආයෝජන ප්‍රවර්ධනය සඳහා නිපැයුම් මධ්‍යස්ථාන වැඩසටහන යටතේ ආයෝජන මණ්ඩලය අනුගමනය කළ ක්‍රියාමාර්ගයන් ද හේතු වී ඇත. 2007 වසරේ විදේශීය සෘජු ආයෝජනයන් තුළ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 221 ක් වූ හිමිකම් ප්‍රාග්ධනය, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 96 ක් වූ කොටස් හිමියන්ගේ ණය සහ අත්තිකාරම්, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 63 ක් වූ අන්තර් සමාගම් ණය ගැනීම්, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 131 ක් වූ විදේශීය ණය සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 223 ක් වූ දැනට පවතින සමාගම්වල රඳවාගත් ඉපැයීම් නැවත ආයෝජනය කිරීම් ඇතුළත් විය. වසර තුළ දී දේශීය සමාගම් කිහිපයක්ම විදේශයන්හි ආයෝජනය කිරීම හේතුවෙන් 2006 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 30 ක විදේශීය සෘජු ආයෝජන යෙදවීම් සමග සසඳා බැලීමේ දී 2007 වසරේ දී එය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 55 ක් දක්වා වැඩිවිය. මහා මාර්ග සහ බලශක්ති සැපයුම වැනි මූලික යටිතල පහසුකම් දියුණු කිරීම සහ ණය අරමුදල් යොදා රජය විසින් දැනට ක්‍රියාත්මක කරගෙන යන ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති වෙනුවට රාජ්‍ය-පුද්ගලික හවුල්කාරිත්වය (PPP) ප්‍රවර්ධනය කිරීම රටෙහි විදේශීය සෘජු ආයෝජන ඉහළ නැංවීමට උපකාරී වනු ඇත. දේපළ හිමිකම් සුරැකීම, නව ආයෝජනයන් සඳහා ඉඩම් කඩිනමින් වෙන්කිරීම, ශීඝ්‍ර සහ කාර්යක්ෂම ලෙස ගැටළු නිරාකරණය සහ ශ්‍රම සංචලනය පහසු කරවීම මගින් හිතකර ව්‍යාපාරික පරිසරයක් පවත්වා ගැනීම ද ඉහළ විදේශීය සෘජු ආයෝජන ලබාගැනීම සඳහා හේතුවේ.

## රජයට ලැබුණු ණය ප්‍රාග්ධනය

### මධ්‍යම සහ දීර්ඝ කාලීන

**සාර්ථක ලෙස ප්‍රථම ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව දියත් කිරීමත් සමග ණය සහ ප්‍රදානවලින් සමන්විත රජයේ විදේශීය ලැබීම් 2007 වසරේ දී ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** උප ප්‍රාථමික උකස් වෙළෙඳපොළ ගැටළු (Sub-Prime Issues) ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළවලට අහිතකර අයුරින් බලපා තිබිය දී ශ්‍රී ලංකාවේ ප්‍රථම ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව පිළිබඳව සෑම කලාපයකම පාහේ ආයෝජකයින්ගේ ඇඩි උද්යෝගය ලබාගෙන අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළෙඳපොළින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 500 ක් සාර්ථක ලෙස එක්රැස්කර ගැනීමට රජයට හැකිවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2006 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් බිලියන 1.2 සමග සසඳා බැලීමේ දී 2007 වසරේ දී එ.ජ.ඩොලර් බිලියන 1.6 ක් වටිනා ණය සහ ප්‍රදාන එක්රැස්කර ගැනීමට රජය සමත් විය. 2006 වසරේ දී වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 932 සමග සසඳා බැලීමේ දී 2007 වර්ෂය තුළ ස්වෛරීත්ව බැඳුම්කර අරමුදල් ඇතුළුව මුළු දිගු සහ මධ්‍ය කාලීන ණය ලැබීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,290 ක් දක්වා ඉහළ ගියේය. මෙම වසරේ ලැබුණු මුළු ණයවලින් සියයට 51 ක් සහනදායී කොන්දේසිවලටත් ඉතිරි සියයට 49 වාණිජමය කොන්දේසිවලටත් යටත්ව ලැබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සහනදායී ණය ලැබීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 660 දක්වා සියයට 6.2 කින් පමණ පහත වැටිණි. බැඳුම්කරවලින් ලද අරමුදල්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සඳහා යොදාගත හැකි වුවද, ණය ලැබීම් තුළින් අනාගත රාජ්‍ය ණය බර ඉහළ යන බැවින් දේශීය/විදේශීය ආයෝජන සහිත රාජ්‍ය-පුද්ගලික හවුල්කාරීත්වය යටතේ විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මෙම බැඳුම්කර අරමුදල් යොදා ගැනීම වාසිදායක වේ. ජංගම හා ප්‍රාග්ධන ස්වභාවයෙන් යුත් මුළු ප්‍රදානයන් 2006 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 287 සිට, 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 277 දක්වා පහළ ගියේය. 2004 වසරේ සිදු වූ සුනාමි ආපදාවෙන් විනාශ වූ යටිතල පහසුකම් නැවත ගොඩනැගීම සඳහා 2006 වසර තුළ රජයට සැලකිය යුතු මුදලක් ප්‍රදාන වශයෙන් ලැබිණි. සංවර්ධන හවුල්කරුවන් විසින් ආධාර කළ ප්‍රධාන ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කළ නමුත්, ණය උපයෝජන අනුපාතය, 2006 වසරේ දී සියයට 22.5 සිට 2007 වසරේ දී සියයට 21.2 දක්වා සුළු වශයෙන් පහළ ගියේය. මේ සඳහා විශාල වශයෙන් හේතු වූයේ වසර තුළ රජයට ලැබුණු නව ව්‍යාපෘති ණය එකඟතාවයන් තුළ ඉදිරි වසර කිහිපය තුළ මුදාහැරීමට යෝජිත ණය විශාල වශයෙන් ඇතුළත් වීමයි. මේ අතර, සුනාමි ව්‍යසනය හේතුවෙන් පැරිස් කණ්ඩායමේ (Paris Club) සාමාජිකයන් 2005 වසරේ දී ලබාදුන් වාරික 7 කින් ආපසු ගෙවිය යුතු ණය පහසුකම්වලින් ණය වාරික 2 ක් නැවත ගෙවීම නිසා රජයේ ණය ආපසු ගෙවීම 2007 වසරේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 618 දක්වා සියයට 40 කින් ඉහළ ගියේය. මෙහි පළමු වාරිකය ගෙවනු ලැබුවේ 2006 වසරේ දී ය.

### කෙටිකාලීන

**2007 වසරේ විදේශිකයන් විසින් රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම හේතුවෙන් මුළු ශුද්ධ කෙටිකාලීන ප්‍රාග්ධන ලැබීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 373 ක් ලෙස වාර්තා විය.** ප්‍රථම වරට 2006 නොවැම්බර් 01 වැනි දින සිට නොපියවූ භාණ්ඩාගාර බැඳුම්කරවල වටිනාකමින් සියයට 5 ක උපරිමයක් දක්වා ආයෝජනය කිරීමට රජය විසින් විදේශිකයන්ට අවසර ලබාදුන් අතර, 2007 දෙසැම්බර් මාසයේ දී එම සීමාව තවදුරටත් සියයට 10 දක්වා ඉහළ දමන ලදී. මෙම බැඳුම්කර සඳහා දීර්ඝ කල් පිරීම් කාලපරිච්ඡේදයක් තිබුණ ද මෙම බැඳුම්කර මත අනිවාර්ය අවම තැන්පතු අවශ්‍යතාවයන්

**5.9 සංඛ්‍යා සටහන**

**2007 වසර තුළ විදේශ ණය දෙන ආයතනවලින් විදේශ ණය ලබාදුන් ව්‍යාපෘතීන්**

| ආයකයා | ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ. ඩොලර් දශ ලක්ෂ |
|---|---|---|
| **ආසියානු සංවර්ධන බැංකුව** | | **134.6** |
| එයින් | දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය | 19.1 |
| | මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 16.2 |
| | බලශක්ති සංවර්ධන ව්‍යාපෘතිය | 13.1 |
| | මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 12.2 |
| | අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රජා ජල සහ සනීපාරක්ෂණ ව්‍යාපෘතිය | 10.2 |
| **ජාත්‍යන්තර සංවර්ධන ආයතනය** | | **74.2** |
| එයින් | මාර්ග සංවර්ධන සහයෝගී ව්‍යාපෘතිය | 18.9 |
| | උතුරු නැගෙනහිර නිවාස නැවත ගොඩනැගීමේ ව්‍යාපෘතිය | 17.9 |
| | ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සහ ප්‍රතිවර්ධන බලශක්ති ව්‍යාපෘතිය | 9.8 |
| **ජපානය** | | **197.0** |
| එයින් | දක්ෂිණ අධිවේගී මාර්ගය ගොඩනැගීමේ ව්‍යාපෘතිය | 32.0 |
| | ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය | 21.3 |
| | කුඩා සහ ක්ෂුද්‍ර කර්මාන්ත නායකත්වය සහ ව්‍යවසායකත්ව පුහුණු ව්‍යාපෘතිය අදියර III (SMILE III) | 19.5 |
| | ශ්‍රී ලංකා සුනාමි හානි ප්‍රදේශ පුනුරුත්තාපන සහ නගා සිටුවීමේ ව්‍යාපෘතිය (STAART) | 15.3 |
| | දිළිඳු ජනතාවට හිතකර වූ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | 15.0 |
| | වලවේ වම් ඉවුරු වාරිමාර්ග සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය II | 13.5 |
| | සුළු පරිමාණ යටිතල පහසුකම් පුනරුත්තාපන පහසුකම් සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (SIRUP II) | 11.0 |
| | පාරිසරික හිතකාමී විසඳුම් ලබාදීමේ අරමුදල II | 10.7 |
| | මහකොළඹ සඳහා කළු ගඟ ජල සැපයුම් ව්‍යාපෘතිය | 10.3 |
| | පලාත්බද මාර්ග දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 9.8 |
| **මහජන චීන සමූහාණ්ඩුව** | | **175.4** |
| එයින් | නොරොච්චෝලේ තාප බලාගාරය | 142.8 |
| | දුම්රිය මැදිරි 100 ක් සැපයීමේ ව්‍යාපෘතිය | 12.5 |
| **යුරෝපීය ආයෝජන බැංකුව** | | **42.9** |
| එයින් | පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ ණය මාර්ග | 28.9 |
| | ඩී.එෆ්.සී.සී. ගෝලීය ණය පහසුකම් II | 13.9 |
| **ඩෙන්මාර්කය** | | **20.8** |
| එයින් | කොළඹ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘතිය | 11.9 |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

නොමැති නිසා සහ ආයෝජකයින්ට තම ආයෝජන ඕනෑම වේලාවක විකිණීමට සහ එම ආයෝජිත මුදල් සහ ප්‍රතිලාභ සිය රට කරා ගෙනයාමට බාධාවක් නොමැති නිසා මෙම බැඳුම්කරවල ලැබීම් කෙටිකාලීන ප්‍රාග්ධනය ලෙස වර්ගීකරණය කෙරේ. භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජිත අරමුදල් ක්ෂණිකව ගෙවීමට සිදුවිය හැකි බැවින් විදේශ විනිමය වෙළෙඳපොළේ ඇතිවන උච්ඡාවචනයන් අවම කිරීම සඳහා එ.ජ.ඩොලර්වලින් සැකසුනු විශේෂිත සංචිතයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇතිකර තිබේ. මෙම සංචිතය විදේශීය බැඳුම්කර හිමියන්ගේ ඉල්ලුම මත ආයෝජනයන් සහ ප්‍රතිලාභ නැවත සිය රටට ගෙනයාමට අවශ්‍ය විදේශ විනිමය අවශ්‍ය පරිදි සැපයීමට යොදා ගැනේ.

### පෞද්ගලික අංශයට සහ රාජ්‍ය සංස්ථාවලට ලැබුණු ණය ප්‍රාග්ධනය

**2007 වසරේ දී පෞද්ගලික අංශයට සහ රාජ්‍ය සංස්ථාවලට ලැබුණු විදේශීය ණය ඉහළ ගියේය.** ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයේ, විශේෂයෙන් ආයෝජන මණ්ඩලයේ අනුමැතියලත් ආයතන ණය ගැනීම් වැඩිවීම හේතුවෙන් පෞද්ගලික අංශයට සහ රාජ්‍ය සංස්ථාවලට ලැබුණු දීර්ඝකාලීන ණය, 2007 දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 199 දක්වා සියයට 43 කින් ඉහළ ගියේය. 2007 වසරේ දී දේශීය පොළී අනුපාත ඉහළ බැවින්, සමහර පෞද්ගලික අංශයේ, විශේෂයෙන්ම විදුලි සංදේශ සහ මූල්‍ය අංශයන්හි ආයතන ඔවුන්ගේ ව්‍යාපාර පුළුල් කිරීම සඳහා විදේශ ණය ලබාගෙන ඇත. රජය විසින් රාජ්‍ය සංස්ථා සඳහා විදේශීය ණය අනුමත කිරීමේ දී පරික්ෂාකාරී වීම නිසා,

වසර තුළ දී රාජ්‍ය සංස්ථා මගින් ණය ලබාගැනීම් සිදුකර නොමැත. කෙසේ වුවත්, තම ආයෝජන අවශ්‍යතාවයන් සඳහා අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළෙඳපොළින් ප්‍රාග්ධනය ලබාගැනීමට, රජය විසින් වර්තමානයේ පෞද්ගලික අංශය දිරිගන්වනු ලැබේ. මේ අනුව, 2008 අයවැය මගින් පෞද්ගලික අංශයේ බාහිර ණය ගැනීම් මත පැනවුණු සීමාවන් 2008 වර්ෂයේ දී ලිහිල් කර ඇත.

### පෞද්ගලික අංශයට ලැබුණු කෙටිකාලීන ණය

ප්‍රධාන වශයෙන් දේශීය බැංකු පද්ධතියෙන් රජය ලබාගන්නා විදේශීය විනිමය ණය ලබාගැනීම් අඩුවීම හේතුවෙන් **මුළු ශුද්ධ කෙටිකාලීන ප්‍රාග්ධන ලැබීම්, 2006 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 610 සමග සසඳා බැලීමේ දී 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 206 ක් දක්වා අඩු විය.** බැංකු පද්ධතියෙන් රජය ලබාගත් ශුද්ධ ණය ලබා ගැනීම් 2006 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 394 සමග සසඳා බැලීමේ දී, 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 200 ක් විය. මේ අතර, කොටස් වෙළෙඳපොළ විවිධ ආයෝජන ශුද්ධ ලැබීම්, 2006 වසරේදී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 51 සමග සසඳා බැලීමේ දී 2007 වසරේ දී එය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 101 දක්වා ළඟා විය. කොළඹ කොටස් වෙළෙඳපොළ ආසියාවේ ඉතාමත් හොඳින් ක්‍රියාත්මක වූ කොටස් වෙළෙඳපොළවල් වලින් එකක් බවට පත්වෙමින් 2007 වසරේ දී දළ ප්‍රාග්ධන ලැබීම් ලෙස එ.ජ.ඩොලර් දශ ලක්ෂ 423 ක් ආකර්ෂණය කර ගැනීමට සමත් විය. විදේශවල ආයෝජනය කළ විදේශ මුදල් තැන්පතු ඉහළ යාම නිසා වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 280 කින් ඉහළ ගියේය. මේ අතර, වාණිජ බැංකු කිහිපයක් වර්ෂය තුළ දී විදේශීය ණය ලබාගැනීම හේතුවෙන් සහ විදේශීය මුදල් තැන්පතු ඉහළයාම හේතුවෙන් 2007 වසරේ දී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වගකීම්, එ.ජ. ඩොලර් දශ ලක්ෂ 364 කින් ඉහළ ගියේය.

### ගෙවුම් තුලනය සහ විදේශ සංචිත

**ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ ශුද්ධ ලැබීම්, ජංගම ගිණුමේ හිඟය පියවීමටත් වඩා ප්‍රමාණවත් වූ හෙයින්, අඛණ්ඩව තුන්වන වසරටත් සමස්ත ගෙවුම් තුලනයේ අතිරික්තයක් වාර්තා විය.** 2006 වසරේදී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 204 සමග සැසඳීමේ දී, සමස්ත ගෙවුම් තුලන අතිරික්තය 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 531 දක්වා වර්ධනය විය. ස්වෛරීත්ව ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව මගින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 500 ක් ලැබීම, මෙම ඉහළ අතිරික්තය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය.

### විදේශ සංචිත

**2007 වසරේදී වාර්තා වූ ගෙවුම් තුලනයේ අතිරික්තය, දළ නිල විදේශ සංචිත ප්‍රමාණය තවදුරටත් වර්ධනය කිරීමට හේතුවිය.** ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් ඇතුළත් නොවූ දළ නිල විදේශ සංචිත ප්‍රමාණය 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ

**5.10 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් (අ)**

| | එ.ජ. ඩොලර් දශ ලක්ෂ (ආ) | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2003 | 2004 | 2005 | 2006 | 2007 |
| 1. රජය | 55 | 95 | 131 | 128 | 99 | 5,320 | 9,897 | 13,417 | 13,789 | 10,768 |
| 2. රාජ්‍ය නියෝජ්‍යතත්වය | - | - | - | - | - | - | - | - | - | - |
| 3. මහ බැංකුව | 2,274 | 2,101 | 2,604 | 2,709 | 3,409 | 219,984 | 219,795 | 265,873 | 291,747 | 370,640 |
| 4. මුළු නිල වත්කම් | 2,329 | 2,196 | 2,735 | 2,837 | 3,508 | 225,304 | 229,693 | 279,290 | 305,536 | 381,408 |
| 5. වාණිජ බැංකු | 889 | 1,243 | 1,466 | 1,169 | 1,448 | 86,011 | 129,987 | 149,656 | 125,867 | 157,454 |
| 6. මුළු විදේශීය වත්කම් | 3,218 | 3,438 | 4,201 | 4,005 | 4,956 | 311,315 | 359,680 | 428,946 | 431,403 | 538,862 |
| 7. දළ නිල වත්කම් මගින් කළ හැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 7.1 වෙළෙඳ භාණ්ඩ | 4.2 | 3.3 | 3.7 | 3.3 | 3.7 | | | | | |
| 7.2 වෙළෙඳ භාණ්ඩ හා සේවා | 3.6 | 2.9 | 3.3 | 2.9 | 3.3 | | | | | |
| 8. මුළු වත්කම් මගින් කළහැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 8.1 වෙළෙඳ භාණ්ඩ | 5.8 | 5.2 | 5.7 | 4.7 | 5.3 | | | | | |
| 8.2 වෙළෙඳ භාණ්ඩ හා සේවා | 5.0 | 4.5 | 5.0 | 4.1 | 4.7 | | | | | |


(අ) සංචිත ගණනය කර ඇත්තේ වෙළෙඳපොළ වටිනාකම අනුව සහ ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් ද ඇතුළත්ව ය.

(ආ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟ වන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්තනය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයින්ට අනුව පරිවර්තනය කර ඇත.

| | 2003 | 2004 | 2005 | 2006 | 2007 |
|---|---|---|---|---|---|
| වසර අවසානයේ දී එ.ජ. ඩොලර් එකකට රුපියල් | 96.74 | 104.61 | 102.12 | 107.71 | 108.72 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

**5.9 රූප සටහන** **කාර්තුමය විදේශ සංචිත**




3,063 ක් දක්වා ඉහළ ගියේය. 2007 වසරේ දී ඛනිජ තෙල් සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ජාත්‍යන්තර මිල ගණන් ඉහළයාම හේතුවෙන් ආනයන වියදම් ඉහළ ගිය ද 2006 වසරේ දී ආනයනිත මාස 3 කට ප්‍රමාණවත් වූ දළ නිල සංචිත 2007 වසරේ දී ආනයනික මාස 3.3 ක කාලයක් සඳහා ප්‍රමාණවත් විය. කෙසේ වෙතත්, විදේශ වත්කම්වල ප්‍රමාණාත්මක භාවය, දළ නිල විදේශ වත්කම්, කෙටිකාලීන ණය සහ වගකීම්වල ප්‍රතිශතයක් ලෙස බැලූ විට, 2006 වසරේ දී වාර්තා වූ සියයට 82 ක සිට 2007 වසරේ දී සියයට 77 දක්වා පහළ යැමට, කෙටිකාලීන ණය සහ වගකීම් සැලකිය යුතු ලෙස ඉහළයාම හේතු විය. මේ අතර, විදේශීය මුදල් තැන්පතුවල සැලකිය යුතු ඉහළයෑමක් පෙන්වමින් වාණිජ බැංකු විසින් තම විදේශ වත්කම් වර්ධනය කර ගැනීම හේතුකොට ගෙන ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් ඇතුළත් නොවූ රටෙහි මුළු විදේශ සංචිත ප්‍රමාණය 2006 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,694 ක සිට 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4,511 දක්වා ඉහළ ගියේය.


## 5.6 විදේශ ණය සහ ණය සේවාකරණය

### විදේශ ණය

**දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රටෙහි මුළු විදේශීය ණය ප්‍රමාණය, වර්ෂ තුනක් පුරා අඛණ්ඩව පහත වැටීමෙන් පසුව 2007 වසරේ දී ඉතා සුළු ප්‍රමාණයකින් ඉහළ ගියේය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස මුළු විදේශ ණය ප්‍රමාණය, 2006 වසරේ දී සියයට 43.2 සිට 2007 වසරේ දී සියයට 44.1 දක්වා ඉහළ ගියේය.** 2007 වසරේ මුළු විදේශීය ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් වටිනාකම අනුව එ.ජ.ඩොලර් දශ ලක්ෂ 14,252 දක්වා සියයට 17 කින් ඉහළ ගියේය. එ.ජ.ඩොලරය අනෙකුත් ප්‍රධාන මුදල් ඒකකයන්ට එරෙහිව අවප්‍රමාණය වීම, එ.ජ.ඩොලර් වටිනාකම අනුව විදේශ ණය තියුණු ලෙස ඉහළයාම සඳහා යම් පමණකට හේතු විය. මුළු විදේශ ණය ප්‍රමාණයෙන් සියයට 38.6 ක් පමණ විශේෂ ගැණුම් හිමිකම් (SDR) වලින් ද, සියයට 25.7 ක් පමණ ජපන් යෙන්වලින් ද, සියයට 21.3 ක් පමණ එ.ජ.ඩොලර්වලින් ද සමන්විත වේ. ඒ අනුව, 2007 වසරේ දී එ.ජ.ඩොලර්වලින් ලද ණය ඉහළ යාමට හේතුවූයේ භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශිකයන් ආයෝජනය කිරීම සහ එ.ජ.ඩොලර්වලින් සැදුම් ලත් ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීමයි. මේ අතර, ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් සහ වාණිජ බැංකු වගකීම් ඇතුළත් මුළු විදේශ ණය සහ වගකීම්, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස, 2006 වසරේ දී සියයට 50.3 ක සිට 2007 වසරේ දී සියයට 51.8 ක් දක්වා ඉහළ ගියේය. වාණිජ බැංකු කිහිපයකින් විදේශ ණය ලබාගැනීම සහ වාණිජ බැංකු ලද විදේශ මුදල් තැන්පතු වැඩිවීමෙන්, වාණිජ බැංකුවල විදේශ වගකීම් 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,493 ක් දක්වා සියයට 25 කටත් වඩා වැඩි ප්‍රතිශතයකින් සැලකියයුතු ලෙස ඉහළ ගියේය.

**විදේශ ණය වලින් වැඩි කොටසක් තවදුරටත් රාජ්‍ය අංශය සතුව පවතී. මැදි හා දිගුකාලීන මුළු ණයවලින් සියයට 91 ක්ම රාජ්‍ය අංශයේ ණය වන අතර, ඉතිරි සියයට 9 පෞද්ගලික අංශය, රාජ්‍ය සංස්ථා සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ජා.මූ.අ.) ලබාගත් ණයවලින් සමන්විත වේ.** රජයේ මුළු විදේශ ණය තොගයෙන් සියයට 86 ක් පමණ සහනදායී ණය වේ. කෙසේ වුවද, ශ්‍රී ලංකාව මැදි ආදායම් ලබන තත්ත්වයට ගමන්කරමින් පවතින නිසා බහුපාර්ශ්වීය මූල්‍ය ආයතනවලින් සහනදායී ණය පහසුකම් ලබාගැනීමේ හැකියාව මධ්‍යකාලීන වශයෙන් බොහෝ දුරට සීමාසහිත වනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, රජයේ වාණිජමය ණය තොගය මධ්‍යකාලීන වශයෙන් ඉහළයාමට ඉඩ ඇත. කෙසේ වෙතත්,

**5.10 රූප සටහන** **විදේශ ණය**



**5.11 සංඛ්‍යා සටහන**

## නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම්

| ශීර්ෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2003 | 2004 | 2005 | 2006 | 2007(අ) | 2003 | 2004 | 2005 | 2006 | 2007 (අ) |
| **1. මැදි හා දිගු කාලීන ණය** | **10,116** | **10,699** | **10,690** | **11,580** | **13,142** | **978,556** | **1,119,155** | **1,091,644** | **1,247,250** | **1,429,212** |
| 1.1 රජය | 8,812 | 9,523 | 9,354 | 10,478 | 12,005 | 852,433 | 996,203 | 955,207 | 1,128,493 | 1,305,225 |
| 1.2 රජය විසින් සහතික කරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය | 602 | 507 | 567 | 465 | 345 | 58,251 | 52,986 | 57,912 | 50,065 | 37,501 |
| 1.3 රජය විසින් සහතික නොකරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය | 334 | 411 | 388 | 393 | 539 | 32,319 | 42,944 | 39,588 | 42,376 | 58,553 |
| 1.4 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ ගැණුම් | 368 | 258 | 381 | 244 | 253 | 35,552 | 27,023 | 38,937 | 26,316 | 27,933 |
| **2. කෙටි කාලීන ණය** | **620** | **647** | **664** | **634** | **1,111** | **59,935** | **67,726** | **67,759** | **68,286** | **120,748** |
| 2.1 රජය (ආ) | - | - | - | - | 457 | - | - | - | - | 49,641 |
| 2.2 අනෙකුත් (ඇ) | 620 | 647 | 664 | 634 | 654 | 59,935 | 67,726 | 67,759 | 68,286 | 71,107 |
| **3. බැංකු අංශය විදේශ වගකීම් (ඈ)** | **1,046** | **1,429** | **1,666** | **1,994** | **2,493** | **101,149** | **149,492** | **170,170** | **214,802** | **271,063** |
| 3.1 මහ බැංකුව | 0 | 1 | 1 | 3 | 2 | 32 | 128 | 131 | 284 | 219 |
| 3.2 වාණිජ බැංකු | 863 | 1,066 | 1,388 | 1,681 | 2,046 | 83,514 | 111,464 | 141,753 | 181,040 | 222,389 |
| 3.3 ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් | 182 | 362 | 277 | 311 | 446 | 17,604 | 37,899 | 28,286 | 33,478 | 48,454 |
| **4. මුළු විදේශීය ණය** | **10,735** | **11,346** | **11,354** | **12,214** | **14,252** | **1,038,491** | **1,186,881** | **1,159,403** | **1,315,536** | **1,549,960** |
| **5. මුළු විදේශීය ණය සහ වගකීම්** | **11,781** | **12,775** | **13,020** | **14,209** | **16,745** | **1,139,640** | **1,336,373** | **1,329,573** | **1,530,338** | **1,821.023** |
| **විශේෂිත අයිතමයන්** | | | | | | | | | | |
| මැදි හා දිගු කාලීන ණය | | | | | | | | | | |
| (1) ව්‍යාපෘති ණය | 6,961 | 7,702 | 7,416 | 8,071 | 8,996 | 673,432 | 805,646 | 757,262 | 869,336 | 978,027 |
| (2) ව්‍යාපෘති නොවන ණය | 1,726 | 1,763 | 1,655 | 1,959 | 2,331 | 167,007 | 184,467 | 169,038 | 210,986 | 253,413 |
| (3) සැපයුම්කරුවන්ගේ ණය | 218 | 240 | 283 | 355 | 679 | 21,048 | 25,123 | 28,907 | 38,242 | 73,785 |
| (4) ජා.මූ.අ. න් කළ ණය | 368 | 258 | 381 | 244 | 253 | 35,552 | 27,023 | 38,937 | 26,316 | 27,933 |
| (5) අනෙකුත් ණය (ඉ) | 843 | 735 | 955 | 870 | 884 | 81,516 | 76,896 | 97,500 | 93,735 | 96,054 |
| **කෙටිකාලීන ණය හා බැංකු අංශයේ වගකීම්** | **1,665** | **2,077** | **2,330** | **2,628** | **3,604** | **161,084** | **217,217** | **237,929** | **283,088** | **391,811** |
| **ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් (උ)** | | | | | | | | | | |
| මුළු විදේශීය ණය | 56.9 | 54.9 | 46.5 | 43.3 | 44.1 | 57.0 | 56.8 | 47.3 | 44.8 | 43.3 |
| බැංකු අංශයේ මුළු විදේශීය වගකීම් | 5.5 | 6.9 | 6.8 | 7.1 | 7.7 | 5.6 | 7.1 | 6.9 | 7.3 | 7.6 |
| මුළු විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම් | 62.4 | 61.8 | 53.3 | 50.3 | 51.8 | 62.5 | 63.9 | 54.2 | 52.1 | 50.9 |
| කෙටිකාලීන ණය | 3.3 | 3.1 | 2.7 | 2.2 | 3.4 | 3.3 | 3.2 | 2.8 | 2.3 | 3.4 |
| කෙටිකාලීන ණය හා බැංකු අංශයේ විදේශීය වගකීම් | 8.8 | 10.0 | 9.5 | 9.3 | 11.1 | 8.8 | 10.4 | 9.7 | 9.6 | 10.9 |
| **මුළු ණයවල ප්‍රතිශතයක් වශයෙන්** | | | | | | | | | | |
| කෙටිකාලීන ණය | 5.3 | 5.1 | 5.1 | 4.5 | 6.6 | 5.3 | 5.1 | 5.1 | 4.5 | 6.6 |
| කෙටිකාලීන වගකීම් | 8.9 | 11.2 | 12.8 | 14.0 | 14.9 | 8.9 | 11.2 | 12.8 | 14.0 | 14.9 |
| කෙටිකාලීන ණය, නිල විදේශීය සංචිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් | 26.6 | 29.5 | 24.3 | 22.4 | 31.7 | 26.6 | 29.5 | 24.3 | 24.4 | 31.7 |

(අ) තාවකාලික
(ආ) අනේවාසිකයන් සඳහා නිකුත් කල භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් වේ.
(ඇ) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය සහ වෙළෙඳ ණය ඇතුළත් කොට ඇත.
(ඈ) ආසියානු නිෂ්කාශන සංගමයේ ණය, අක්වෙරළ බැංකු ඒකක සහ වාණිජ බැංකුවල විදේශ වගකීම් ඇතුළත් වේ.
(ඉ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගුකාලීන ණය.
(උ) 2003 වසරේ සිට ද.දේ.නි. යට අදාල දත්තයන් ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලැබේ.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව



ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇතැම් විට රජය සමග හවුල්ව ක්‍රියා කිරීමට දේශීය සහ විදේශීය ආයෝජකයින් දිරිගැන්වීම තුළින්, වාණිජ ණය තොගය රජයට කළමනාකරණය කළහැකි මට්ටමින් පවත්වාගත හැකිය. මේ අනුව, පෞද්ගලික අංශය, විශේෂයෙන්ම මූල්‍යමය අතින් ශක්තිමත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර, එවැනි යටිතල පහසුකම් ව්‍යාපෘති මූල්‍යනය කිරීමට සහ ඔවුන්ගේ ව්‍යාපාරවල මෙහෙයුම් කටයුතු සඳහා අන්තර්ජාතික වෙළෙඳපොළවලින් සහ බහුපාර්ශ්වීය මූල්‍ය ආයතනවලින් මධ්‍ය සහ දිගුකාලීන විදේශ ණය ලබාගැනීමට දිරිගැන්වීම අවශ්‍ය වේ. මේ මගින් විදේශ මාර්ගවලින් ණය මුදල් ලබාගත නොහැකි

පෞද්ගලික අංශයේ ආයතනවලට දේශීය මූල්‍ය වත්කම් භාවිතා කිරීමට ඉඩ සැලසේ.

### විදේශ ණය සේවාකරණ ගෙවීම්

ණය වාරික සහ පොළී ගෙවීම් වලින් සමන්විත මුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම්, 2007 වසරේ දී එ.ජ.ඩොලර් වටිනාකම අනුව සියයට 14.1 කින් ඉහළ ගිය නමුත්, වෙළෙඳ භාණ්ඩ අපනයන සහ සේවාවන්හි ප්‍රතිශතයක් ලෙස සියයට 13 ක මට්ටමේ පැවතිණි. 2005 වසරේ දී සුනාමි ව්‍යසනය හේතුවෙන් ලබාදුන් ණය ගෙවීම් පමා කිරීමේ පහසුකම අවසන් වීමත් සමගම 2006 වසරේ සිට සැලසුම්ගත ණය සේවාකරණ ගෙවීම් ක්‍රියාත්මක වීම, ආරක්ෂණ ණය ආපසු ගෙවීම් ඉහළයාම, රජයේ වාණිජමය ණයවල සේවාකරණ වියදම් ඉහළයාම සහ ප්‍රධාන මුදල් වර්ග වලට එරෙහිව එ.ජ.ඩොලරය අවප්‍රමාණය වීම, 2007 වසරේ දී මුළු ණය සේවාකරණ ගෙවීම් එ.ජ.ඩොලර් වටිනාකමට අනුව සැලකිය යුතු ලෙස ඉහළයාමට හේතු විය. රටක විදේශ ණය සේවාකරණ හැකියාව මනින මිනුම් දණ්ඩක් වන ණය සේවාකරණ අනුපාතය තවමත් සතුටුදායක මට්ටමක පවතින්නේ ශ්‍රී ලංකාවේ විදේශ ණය තොගය තුළ සහනදායී සහ දිගු පරිණත කාලයකින් සමන්විත විශාල ණය ප්‍රමාණයක් පැවතීම සහ භාණ්ඩ සහ සේවා අපනයන ඉපැයීම් අඛණ්ඩව වර්ධනය වීම නිසාය.

## 5.7 විනිමය අනුපාත ක්‍රම සහ විනිමය අනුපාතයෙහි වෙනස්වීම්

පාවෙන විනිමය අනුපාත ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රුපියල, තවදුරටත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව දැඩි වේගයකින් අවප්‍රමාණය නොවන නමුත් විනිමය අනුපාත තීරණය කරන ඉල්ලුම් සහ සැපයුම් වෙළෙඳපොළ බලවේගවලට සහ වෙළෙඳපොළෙහි අධික උච්ඡාවචනයන් අවම කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන සීමාසහිත මැදිහත් වීම්වලට ප්‍රතිචාර දක්වයි. ඔක්තෝබර් මාසයේ දී රුපියල එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 5 ක් පමණ ඉහළ වේගයකින් අවප්‍රමාණය වෙමින් තිබූ අතර, එම මාසයේ දී සිදු කල ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුවේ මුදල් ප්‍රවාහ ලැබීම් හේතුවෙන් අවප්‍රමාණය වීමේ උපනතිය ආපසු හැරවීමට සමත්විය. නොපියවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බැඳුම්කරවලින්, විදේශ හිමිකාරිත්ව සීමාව

**5.12 සංඛ්‍යා සටහන**

**විදේශ ණය සේවාකරණ ගෙවීම්**


| ශීර්ෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2003 | 2004 | 2005 | 2006 | 2007(අ) | 2003 | 2004 | 2005 | 2006 | 2007(අ) |
| 1. ණය සේවා ගෙවීම් | 761 | 843 | 623 | 1,080 | 1,232 | 73,125 | 85,318 | 62,577 | 112,670 | 136,508 |
| 1.1 ණය ආපසු ගෙවීම් | 526 | 594 | 419 | 759 | 791 | 50,502 | 59,990 | 42,075 | 79,227 | 87,731 |
| (i) ජා. මූ. අරමුදලට | 32 | 107 | 39 | 144 | 5 | 2,869 | 10,718 | 3,902 | 15,276 | 789 |
| (ii) අනෙකුත් | 493 | 487 | 380 | 615 | 786 | 47,632 | 49,272 | 38,173 | 63,952 | 86,942 |
| 1.2 පොළී ගෙවීම් | 235 | 249 | 204 | 321 | 441 | 22,623 | 25,328 | 20,502 | 33,443 | 48,777 |
| (i) ජා. මූ. අරමුදලට | 4 | 10 | 10 | 14 | 14 | 414 | 988 | 973 | 1,452 | 1,509 |
| (ii) අනෙකුත් | 230 | 240 | 194 | 307 | 427 | 22,209 | 24,340 | 19,530 | 31,991 | 47,268 |
| 2. වෙළෙඳ භාණ්ඩ අපනයනය හා සේවාවන්ගේ ඉපැයීම් | 6,544 | 7,284 | 7,887 | 8,508 | 9,452 | 631,549 | 738,714 | 793,153 | 885,380 | 1,046,074 |
| 3. වෙළෙඳ භාණ්ඩ අපනයන සේවා, ආදායම් හා පෞද්ගලික සංක්‍රාම | 8,127 | 9,004 | 9,891 | 10,980 | 12,403 | 784,408 | 912,817 | 994,751 | 1,142,515 | 1,373,101 |
| 4. ණය සේවා අනුපාතිකය (ආ) | | | | | | | | | | |
| 4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 11.6 | 11.6 | 7.9 | 12.7 | 13.0 | 11.6 | 11.5 | 7.9 | 12.7 | 13.0 |
| ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර | 11.1 | 10.0 | 7.3 | 10.8 | 12.8 | 11.1 | 10.0 | 7.3 | 10.8 | 12.8 |
| 4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 9.4 | 9.4 | 6.3 | 9.8 | 9.9 | 9.3 | 9.3 | 6.3 | 9.9 | 9.9 |
| ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර | 8.9 | 8.1 | 5.8 | 8.4 | 9.8 | 8.9 | 8.1 | 5.8 | 8.4 | 9.8 |
| 5. රජයේ ණය සේවා ගෙවීම් | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවා ගෙවීම් (ඇ) | 502 | 484 | 268 | 442 | 467 | 48,452 | 48,952 | 26,927 | 45,996 | 51,694 |
| 5.2 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 66.0 | 57.4 | 43.0 | 41.0 | 37.9 | 66.3 | 57.4 | 43.0 | 40.8 | 37.9 |

(අ) තාවකාලික
(ආ) වසර තුළ විනිමය අනුපාතිකයෙහි සිදු වූ වෙනස්වීම් හේතුවෙන් රුපියල් වටිනාකම හා එ.ජ.ඩොලර් වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගත් කල ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.
(ඇ) ජා.මූ.අරමුදලෙහි ගනුදෙනු හැර


මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

**5.11 රූප සටහන** **විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම්**

**එ.ජ. ඩොලරයට එරෙහි රුපියලේ අගය**




**සඵල විනිමය අනුපාත දර්ශක (2006 = 100) මුදල් වර්ග 24 පැස අනුව**




සියයට 5 සිට සියයට 10 තෙක් 2007 දෙසැම්බර් මසදී ඉහළ දැමීම සහ ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව එ.ජ.ඩොලරය දුර්වලවීම නිසා රුපියල අධිප්‍රමාණය වීමේ ස්වභාවය තවදුරටත් ශක්තිමත් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2006 වසරේ දී සියයට 5.2 කින් අවප්‍රමාණය වූ රුපියල 2007 වසර අවසානයේදී එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 0.93 කින් ආන්තිකව අවප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියල, බ්‍රිතාන්‍ය පවුමට (සියයට 2.7) සහ ජපාන යෙන් වලට (සියයට 5.6) එරෙහිව අඩු අනුපාතිකයකින් අවප්‍රමාණය වූ අතර, ඉන්දියානු රුපියල (සියයට 11.9) සහ යුරෝවලට (සියයට 10.9) එරෙහිව ඉහළ අනුපාතයකින් අවප්‍රමාණය විය.

### නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතය

2007 වසරේ දී නාමික සඵල විනිමය අනුපාතය 2006 වසරට වඩා අඩු අනුපාතයකින් අවප්‍රමාණය වූ අතර මූර්ත සඵල විනිමය අනුපාතය තවදුරටත්

**5.13 සංඛ්‍යා සටහන** **විනිමය අනුපාතික වෙනස්වීම්**

| | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම(අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය | | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2005 | 2006 | 2007 | 2005 | 2006 | 2007 | 2006 | 2007 | 2006 | 2007 |
| යුරෝ | 120.96 | 141.58 | 160.27 | 125.10 | 130.63 | 151.63 | -14.56 | -11.66 | -4.24 | -13.85 |
| ඉන්දියානු රුපියල් | 2.27 | 2.44 | 2.77 | 2.28 | 2.30 | 2.69 | -7.19 | -11.83 | -0.86 | -14.42 |
| ජපන් යෙන් | 0.87 | 0.91 | 0.97 | 0.91 | 0.89 | 0.94 | -4.30 | -6.83 | 2.26 | -4.96 |
| බ්‍රිතාන්‍ය පවුම් | 175.94 | 211.29 | 217.15 | 182.87 | 191.53 | 221.46 | -16.73 | -2.70 | -4.52 | -13.51 |
| එක්සත් ජනපද ඩොලර් | 102.12 | 107.71 | 108.72 | 100.50 | 103.96 | 110.62 | -5.19 | -0.93 | -3.33 | -6.02 |
| විශේෂ ගැනුම් හිමිකම් | 145.95 | 162.03 | 171.57 | 148.45 | 153.00 | 169.37 | -9.92 | -5.56 | -2.97 | -9.66 |

| සඵල විනිමය අනුපාත දර්ශක (ආ) (ඇ) | මාසික දර්ශකය | | | වාර්ෂික සාමාන්‍යය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2005 දෙසැ. | 2006 දෙසැ. | 2007 දෙසැ. | 2005 | 2006 | 2007 | 2006 | 2007 | 2006 | 2007 |
| නා.ස.වි.අ. (2006=100) | 104.77 | 94.35 | 87.79 | 104.06 | 100.00 | 89.23 | -9.95 | -6.95 | -3.86 | -10.81 |
| මූ.ස.වි.අ. (2006=100) | 100.15 | 99.26 | 106.84 | 97.66 | 100.00 | 100.17 | -0.89 | 7.64 | 2.40 | 0.17 |

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි.

(ආ) නාමික සඵල විනිමය අනුපාතය (නා.ස.වි.අ.) යනු වෙළෙඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමග සිදු කරන වෙළෙඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. සෘණ ලකුණින් අගය අඩුවීම පෙන්නුම් කරයි.

(ඇ) මූර්ත සඵල විනිමය අනුපාතය (මූ.ස.වි.අ.) නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


අධිප්‍රමාණය විය. ප්‍රධාන මුදල්වලට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ මධ්‍යස්ථ නාමික අවප්‍රමාණය පෙන්නුම් කරමින්, මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතය, 2006 වසර සමග සැසඳීමේ දී 2007 දී අඩු අනුපාතයකින් අවප්‍රමාණය විය. මේ අතර එක් එක් රටවල නාමික විනිමය අනුපාතයේ වෙනස්වීම්වලට අමතරව උද්ධමන අනුපාතයේ වෙනස්වීම් ගලපා සලකා බලනු ලබන මූර්ත සඵල විනිමය අනුපාතය, 2007 වසර තුළ තවදුරටත් අධිප්‍රමාණය වීමෙන් පෙන්නුම් කරන්නේ උද්ධමන වෙනස්වීම්වලට අනුරූපීව ශ්‍රී ලංකාවේ අපනයනවල තරගකාරිත්වය අඩුවී ඇති බවයි. මෙය වෙළෙඳ හවුල්කාර සහ තරගකාරී රටවල් සමග සසඳා බලන කළ සාපේක්ෂව ඉහළ දේශීය උද්ධමනයේ සහ 2007 දී රුපියලෙහි සිදු වූ අවම නාමික අවප්‍රමාණයේ ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකිය.

### දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වර්ධනයන්

**2007 වසර තුළ දී ජාත්‍යන්තර වෙළෙඳාමේ ඉහළ වර්ධනය, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ හා විදේශීය සෘජු ආයෝජනවල ඉහළ වර්ධනය සහ භාණ්ඩාගාර බැඳුම්කර මත විදේශීය ලැබීම් වර්ධනය වුවද, අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය පහත වැටුණි.** විදේශ විනිමය උපයන්නන් සහ විදේශ විනිමය හුවමාරුකරුවන් ශ්‍රී ලංකා රුපියලේ දැඩි අවප්‍රමාණය වීමක් අපේක්ෂා කිරීම නිසා වසරේ පළමු කාර්තු තුන ඇතුළත වෙළෙඳපොළ ක්‍රියාකාරකම් පහළ මට්ටමක පැවතිණ. ශ්‍රී ලංකාවේ ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සාර්ථකව නිම කිරීම සහ රුපියලෙහි අවප්‍රමාණය වීමේ නැඹුරුව වෙනස්වීමත් සමග 2007 වසරේ අවසාන කාර්තුව තුළ විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් සැලකිය යුතු මට්ටමකින් වර්ධනය විය. 2007 වසරේ දී පළමු කාර්තු තුන ඇතුළත විදේශ විනිමය වෙළෙඳපොළේ ක්‍රියාකාරී මට්ටමට සමගාමීව විදේශ විනිමය වෙළෙඳපොළේ ඉදිරි විනිමය ගනුදෙනු පහළ යාමේ ස්වරූපයක් පෙන්නුම් කළ අතර 2007 වසරේ සිව්වන කාර්තුවේදී නැවත ක්‍රියාකාරී මට්ටමකට ළඟාවිය.

**විදේශ විනිමය වෙළෙඳපොළේ අධික උච්ඡාවචනයන් සමනය කිරීමට සහ නිල සංචිත ඉහළ නැංවීමට 2007 වසර පුරා ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතුවලට මැදිහත් විය.** විනිමය අනුපාතයේ තියුණු උච්ඡාවචනයන් වැළැක්වීම සඳහා වර්ෂය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය

**5.12 රූප සටහන** **ත්‍රෛමාසික අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු (පරිමාව)**




වෙළෙඳපොළ කටයුතුවලට දෙඅංශයෙන්ම මැදිහත් විය. 2007 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව එ.ජ.ඩොලර් දශ ලක්ෂ 593 ක් අන්තර් බැංකු වෙළෙඳපොළෙන් අවශෝෂණය කිරීමෙන් සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 716 ක විදේශ විනිමය සැපයීමෙන් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2006 වසරේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 484 ක ශුද්ධ සැපයීම් සමග සැසඳීමේ දී 2007 වසරේ දී ශුද්ධ සැපයීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 123 ක් පමණක් විය. ආනයන සහ අපනයන කර්මාන්තයන්හි ඵලදායීතාවය වර්ධනය කිරීම තුළින් රුපියල අධිප්‍රමාණය වීමෙන් ඇතිවන අහිතකර ප්‍රතිවිපාක අවම කරගැනීමට හැකිවනු ඇත. විනිමය අනුපාතය අධිප්‍රමාණය වීම නිසා ජාත්‍යන්තර වෙළෙඳපොළේ වෙළෙඳ භාණ්ඩ මිල ගණන් ඉහළයෑමේ ප්‍රතිවිපාක ද මඳ වශයෙන් සමනය කරනු ලබයි.

**රුපියල මුල්කරගත් සම්ප්‍රදායික එතැන් වෙළෙඳපොළ සහ ඉදිරි විනිමය වෙළෙඳපොළේ සිදුවන විදේශ විනිමය මිල දී ගැනීම් හා විකිණීම්වලට අමතරව, 2007 වසර තුළ දී ව්‍යුත්පන්න උපකරණ භාවිතයෙන් සිදුකෙරුණු විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතුවල විශාල වර්ධනයක් පෙන්නුම් කළේය.** ඛනිජ තෙල් මිල උච්ඡාවචනයන් වැළැක්වීම පිණිස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තම ඛනිජ තෙල් මිල දී ගැනීම්වලින් කොටසක් ආනයනය කිරීම සඳහා 2007 පෙබරවාරි මාසයේ දී ශුන්‍ය පිරිවැය පරාස ක්‍රමය ඔස්සේ මිල ඉදිරි රැකුම් ගිවිසුම් 2 කට එළඹුන අතර ඉන්පසුව වෙළෙඳපොළ වර්ධනයන්ට අනුකූලව ඉදිරි රැකුම් ගිවිසුම්වලට එළඹීම අඛණ්ඩව කරගෙන යන ලදී. 2007 වසරේ දී මිල ඉදිරි රැකුම් ක්‍රමය තුළින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් දශ ලක්ෂ 209 ක ඉතිරියක් කර ඇත.

**විශේෂ සටහන 13**

## සංචාරක කර්මාන්තය: එහි විභවතාවය ප්‍රයෝජනයට ගැනීම

සංචාරක කර්මාන්තය ලෝකයේ විශාලතම සහ වේගයෙන් දියුණුවන කර්මාන්තයක් බවට පිළිගෙන ඇත. ආදායම ඉහළ යාම සහ ගමනාගමනය සඳහා පැවැති බාධාවන් ඉවත් කිරීමත් සමග මිනිසුන් රටකින් රටකට සංචාරය කිරීමට පෙළඹෙන අතර, එමගින් සත්කාරක රටෙහි නව ආදායම් හා රැකියා අවස්ථා උත්පාදනය වේ. 2007 වසරේ සංචාරක පැමිණීම් මිලියන 900 ක පමණ නව වාර්තාවක් සමගින් ජාත්‍යන්තර සංචාරක අපේක්ෂාවන් අභිබවා යන ලදී[1]. සංචාරකයන් පාරිභෝජනය කරනු ලබන භාණ්ඩ හා සේවා මගින් ආදායම් උත්පාදනය වනවා මෙන්ම සේවා කර්මාන්තයන් වන, ප්‍රවාහන, හෝටල් පහසුකම් සහ විනෝදාස්වාදන යන අංශයන් මගින් රැකියා අවස්ථාවන්ද උත්පාදනය වීම සිදුවේ. විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවලට ඔවුන්ගේ ගෝලීය ආර්ථික සහභාගීත්වය වර්ධනය කිරීමේ අංශයන් අතර සංචාරක කර්මාන්තය ප්‍රධාන ස්ථානයක් ගනී.

ලංකාවේ සංචාරක කර්මාන්තයේ සංවර්ධනය කළ හැකි අවස්ථාවන් තවමත් නිසි අයුරින් භාවිතයට ගෙන නැත. ශ්‍රී ලංකාව හා සසඳන විට සිංගප්පූරුව සතු සම්පත් ප්‍රමාණය වඩා අඩු වුවද, 2007 වසරේ දී සිංගප්පූරුවට සංචාරකයින් දශ ලක්ෂ 10.5 ක් ආකර්ශණය කර ගන්නා ලදී[2]. ඉන්දියාවේ සංචාරක කර්මාන්තය, 2002 සිට 2007 දක්වා කාලය තුළ සුවිශේෂ වර්ධනයක් අත්කර ගෙන ඇති අතර, 2007 වසරේ දී සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 11,956 දක්වා ඉහළ වේගයකින් සියයට 33.8 කින් වර්ධනය වන ලදී[3]. මෑත වසරවලදී, මාලදිවයින තම ස්වභාවික සම්පත් වන කුඩා කොරල් දූපත්වල ඇති අපවිත්‍ර නොවූ වෙරළ, නිවර්තන කලාපීය මත්ස්‍යයන් බහුලව ගැවසෙන කිමිදිය හැකි පිරිසිදු මුහුද සහ ආකර්ශණීය හිරු එළිය සාර්ථකව අලෙවි කර ඇත. සංචාරක කර්මාන්තය මගින් වර්තමානයේ දී වසරකට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 450 ක ප්‍රමාණයක් මාලදිවයිනට ගෙන එයි. විදේශ විනිමය ඉපැයීම අතින් සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ සිව්වැනි විශාල කර්මාන්තය වුවද, එමගින් උපයනු ලබන්නේ වසරකට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 400 ක පමණ ප්‍රමාණයකි. ශ්‍රී ලංකාවේ වටිනා සංස්කෘතික උරුමයන්, විවිධාකාර වූ දර්ශණීය ස්ථාන සහ වනජීවී සම්පත් සංචාරක කර්මාන්තය සඳහා විශාල ශක්‍යතාවක් සපයනු ලබයි. නමුදු ශ්‍රී ලංකාවේ දී සංචාරකයන් විසින් එක් දිනක් සඳහා දරනු ලබන මුළු වියදම (තරු පහේ හෝටල් සඳහා) එ.ජ.ඩොලර් 100-150 අතර වන අතර මාලදිවයිනේ සහ ඉන්දියාවේ එම අගය එ.ජ.ඩොලර් 600 - 800 අතර අගයක් ගනී. විශේෂයෙන් නැගී එන වෙළෙඳපොළවල් වන ඉන්දියාව හා චීනය වැනි රටවල් ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය විවිධාංගීකරණය සහ ප්‍රවර්ධනය කිරීම මගින්, සංචාරක කර්මාන්තය ව්‍යාප්ත කිරීමේ සහ සංවර්ධනය කිරීමේ අවස්ථා ඇත. 2005 වසරේ සිට ඉන්දියාව, ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීම් සම්බන්ධයෙන් ඉහළම දායකත්වය සපයන්නා වී ඇත. එසේම මැද පෙරදිග රටවල් ද ශ්‍රී ලංකාවට සංචාරකයින් සපයන සංවර්ධනය කළ හැකි වෙළෙඳපොළක් ලෙස පවතී. සංචාරක මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ දී මෙම වෙළෙඳපොළවල් ඉලක්ක කර මනාව සැලසුම් කරන ලද උපක්‍රමශීලී අලෙවිකරණ සැලසුම් මගින් මැදිකාලීනව හා දිගුකාලීනව ඉමහත් ප්‍රතිලාභ අත්කර ගත හැක.

**සංඛ්‍යා සටහන වි.ස. 13.1**
**තෝරාගන්නා ලද රටවල සංචාරක පැමිණීම් (දහස්)**

| රට | 2006 | 2007(අ) | වර්ධනය % |
|---|---|---|---|
| සිංගප්පූරුව | 9,751 | 10,493 | 7.6 |
| ඉන්දියාව | 4,447 | 4,977 | 11.9 |
| ඉන්දුනීසියාව | 4,871 | 5,505 | 13.0 |
| මාලදිවයින | 602 | 676 | 12.3 |
| ශ්‍රී ලංකාව | 560 | 494 | -11.7 |

(අ) තාවකාලික

මූලයන්: සංචාරක මණ්ඩලය - සිංගප්පූරුව
සංචාරක අමාත්‍යාංශය - ඉන්දියාව
සංස්කෘතික සහ සංචාරක අමාත්‍යාංශය - ඉන්දුනීසියාව
සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය - මාලදිවයින

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට විශාල ශක්‍යතාවක් තිබෙන බව ඉහත සඳහන් තොරතුරු මගින් පැහැදිලි වේ. රජය විසින් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා අවස්ථාවන් හඳුනාගෙන ඇති අතර, විවිධ දිරිගැන්වීම් ලබා දී ඇත. 2007 වසරේ දී, රජය සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සහන සහ දිරිගැන්වීම් මාලාවක් අනුමත කර ඇත. 2007 වසරේ ජූලි මාසයේ දී මුදල් අමාත්‍යාංශය විසින් සංචාරක කර්මාන්තය සඳහා තාවකාලික සහන යෝජනා පෙළක් ප්‍රකාශයට පත්කරන ලදී. 2006 වසරේ අයවැය මගින් පනවන ලද එ.ජ.ඩොලර් 10 ක වීසා ගාස්තුව ක්‍රියාවට නැංවීම 2007 වසර දක්වා කල්දැමීම, ලංකා විදුලිබල මණ්ඩලය විසින් "අඩු බදු" කාණ්ඩය යටතේ හෝටල් සහ අනෙකුත් අදාළ ආයතන වර්ගීකරණය කිරීම, සුනාමියෙන් විපතටපත් වූ හෝටල් සඳහා ලබාදුන් ණයවල ප්‍රාග්ධන ගෙවීම් සඳහා සහන කාලයක් සැලසීම, "සංචාරක කටයුතු" සඳහා එකතුකළ අගය මත බදු ගෙවීම තාවකාලිකව වසරකින් කල් දැමීම සහ 2008 මාර්තු අග දක්වා එකතු කළ අගය මත බදු ගෙවීම පමාවීමේ දී දඩ මුදලක් අය නොකිරීම මෙම දිරිගැන්වීම් අතර වේ.

1. ලෝක සංචාරක සංවිධානය
2. සංචාරක මණ්ඩලය - සිංගප්පූරුව
3. සංචාරක අමාත්‍යාංශය - ඉන්දියාව

2007 ඔක්තෝබර් මස පළමුවෙනිදා සිට බලපැවැත්වෙන පරිදි 2005 අංක 38 දරන සංචාරක පනත හඳුන්වාදීම, 2007 වසරේ දී සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් සිදුවූ වැදගත් සිදුවීමකි. නව සංචාරක පනත හඳුන්වාදීමත් සමග පසුගිය වසර 41 ක් පුරා පැවැති 1966 අංක 20 දරන ශ්‍රී ලංකා සංචාරක පනත අහෝසි විය. සිදුකරන ලද පරිපාලනමය විමධ්‍යගතකරණය හේතුවෙන් ස්වධීනව කටයුතු කළ හැකි ව්‍යවස්ථාපිත ආයතන හතරක් ස්ථාපනය කරන ලදී. එනම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය වේ[4]. මෙම නව ආයතන විසින් සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ සංවර්ධනය, සැලසුම් කිරීම, ප්‍රමිතීන් හඳුන්වා දීම, කළමනාකරණය සහ ප්‍රවර්ධනය සේම මානව සම්පත් වර්ධනය යන අංශ පිළිබඳවද කටයුතු කරනු ඇත. මෙම පරිපාලන ආකෘතීන් බිහිකිරීම තුළ අගය කළයුතු ලක්ෂණය වන්නේ, එමගින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ සියලුම ක්‍රියාමාර්ගවල දී රජය සමග ශක්තිමත් සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට විශාල, මධ්‍යම සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් හට සම අයිතිවාසිකම් ලැබීමය. ඒ අනුව සංචාරක කර්මාන්තය කළමනාකරණයේ දී සහ පාලනයේ දී නව සංචාරක පනත මගින් වඩාත් ඵලදායී රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාවයක් ඇතිවන බවට අපේක්ෂා කරනු ලබයි.

අහිතකර ප්‍රචාරණය සහ ආරක්ෂාව සම්බන්ධ ගැටළු අඩු සංචාරක පැමිණීම් සඳහා හේතු වූ බව හඳුනාගෙන ඇති අතර තවමත් කර්මාන්තයෙහි සැලකිය යුතු අවධානයක් යොමු කළ යුතු අංශ කිහිපයක් ඇත. "නිවර්තන දේශගුණය හා වෙරළ ආශ්‍රිත සංචාරය" (sun and beach tourism) විදේශීය සංචාරකයින් බොහොමයක් ආකර්ශණය කළ ද, පාරිසරික, ජල ක්‍රීඩා සහ ත්‍රාසජනක ක්‍රියා, ආයුර්වේද, සාගර සංචාර, සහ ගොල්ෆ් යන සංචාරක ව්‍යාපාරයන් යන විකල්ප සංචාරක ව්‍යාපාරයන් සම්බන්ධයෙන් සුවිශේෂ අවස්ථාවන් පැවැතිය ද, ඒවා ප්‍රවර්ධනය වී ඇත්තේ සුළු වශයෙනි. සංචාරක ව්‍යාපාරයේ ජාත්‍යන්තර වර්ධනය සමග පාරිසරික සංචාරක ව්‍යාපාරය වේගයෙන් ජනප්‍රිය වෙමින් පවතී. ඇවිදීම, පාපැදි සවාරි, කුරුල්ලන් නැරඹීම සහ වනජීවී සංචාරයන් වැනි ක්‍රියාකාරකම් ගත් විට ශ්‍රී ලංකාව පාරිසරික සංචාරක ව්‍යාපාරය සඳහා සුදුසු ස්ථානයක් වේ. තවද, අලංකාර සහ විවිධත්වයෙන් යුතු භූ පිහිටීම සහ නැගී එන ව්‍යාපාරයක් වන ත්‍රාසජනක ක්‍රියාවන් හා සම්බන්ධ සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ සාර්ථකව දියුණු කළ හැක. වර්තමානයේ ඉන්දියාවේ ආයුර්වේද සංචාරක ව්‍යාපාරය තුළ සෞඛ්‍ය සේවා සැපයීම් සම්බන්ධ සුවිශේෂී වෙළෙඳපොළ වේගයෙන් දියුණු වන මූලික අංගයක් බවට පත්ව ඇත. ශ්‍රී ලංකාවේ ද ආයුර්වේද සංචාරක වෙළෙඳපොළ වර්ධනය කිරීම සඳහා අවස්ථා ඇති අතර, එය අපගේ "සංචාරක අංශය" තුළ වැදගත් කොටසක් බවට පත්කළයුතු වේ. ඒ සමගම රටෙහි නැගෙනහිර සහ අනෙකුත් වෙරළවල, අපවිත්‍ර නොවූ වෙරළ සංවර්ධනය කිරීම මගින් "නිවර්තන දේශගුණය හා වෙරළ ආශ්‍රිත සංචාරය" (sun and beach tourism) තවදුරටත් වර්ධනය කළ හැක.

සංචාරක ව්‍යාපාරය මුහුණ දෙන තවත් විශාලතම අභියෝගයක් වන්නේ, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සංචාරකයන්ගේ විශ්වසනීයත්වය පවත්වා ගැනීම සහ ශ්‍රී ලංකාවෙන් සංචාරකයන් ඉවත් වීම වැළැක්වීමය. මේ අරමුණ සඳහා ජාත්‍යන්තර වශයෙන් වඩාත් ක්‍රියාකාරී අලෙවිකරණ වැඩපිළිවෙළවල් සහ වෙළෙඳ ප්‍රචාරණ ව්‍යාපාර ක්‍රියාත්මක කළයුතු වේ. ක්‍රියාකාරී ලෙස අන්තර්ජාතික සංචාරක වෙළෙඳපොළවලට සහභාගිවීම ශ්‍රී ලංකාව පිළිබඳව සංචාරකයන්ගේ සහ ලෝක ප්‍රජාවගේ විශ්වසනීයත්වය වැඩි කිරීමට උපකාරී විය හැක. ඒ සමගම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ දී සංචාරක ව්‍යාපාරයේ යටිතල පහසුකම් වන හෝටල් සහ අනෙකුත් නවාතැන් පහසුකම්, බැංකු පහසුකම් සහ ප්‍රවාහන පහසුකම් ආදිය ජාත්‍යන්තර මට්ටම දක්වා ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. සංචාරක ව්‍යාපාරය මගින් සමහර අවස්ථාවල දී මානව සම්පත් අපයෝජනයට ලක්වන බැවින්, එවැනි අපයෝජනයන් වැළැක්වීම සඳහා සියලුම ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය විධිවිධාන සැලසිය යුතුය.

රජය මගින් ලබාදෙන දිරිගැන්වීම් සහ සහනාධාර මත සංචාරක ව්‍යාපාරය සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය රඳාපවතින බවට මතයක් පවතී. රජයේ කාර්යභාරය විය යුත්තේ පහසුකම් සැපයීම, නියාමනය හා අධීක්ෂණය, සැලසුම් කිරීම සහ ඒකාබද්ධතාවය සමගින් සංචාරක කර්මාන්තය හා සම්බන්ධ සැලසුම් ආර්ථික හා සමාජ රාමුවක් සමඟ ඒකාබද්ධ කරවීමය. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට අභියෝග රැසක් ජයගතයුතු වුවද, රජයේ ඇඩි මැදිහත්වීමකින් තොරව කර්මාන්තය දියුණුවීමේ හැකියාව තිබිය යුතුය. මේ සම්බන්ධයෙන් කදිම උදාහරණයක් වන්නේ වෙළෙඳපොළ අවශ්‍යතාවන් සපුරාලමින් කර්මාන්තය විසින්ම ගන්නා ලද ක්‍රියාමාර්ග තුලින් දියුණු වූ ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තයයි.

අලංකාර වෙරළ, නොගැඹුරු මුහුද සහ අනෙකුත් සම්පත්වලින් යුක්ත වූ, අලුතින් නිදහස් වූ, නැගෙනහිර පළාත, රටේ සංචාරක කර්මාන්තයේ වර්ධනය සඳහා ඇති විශාලතම අවස්ථාවක් වේ. පෞද්ගලික අංශය විදේශීය සහයෝගීතාවය සමගින් හෝ මෙම සම්පත් කඩිනමින් දියුණු කිරීමට උනන්දු කරවිය යුතු වේ.

ලෝකයේ ජනප්‍රිය සංචාරක මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව දිගු කාලීනව නමක් දිනාගෙන ඇත. ඉතා හොඳින් සැලසුම්කරණය සහ කළමනාකරණය කළහොත් සංචාරක ව්‍යාපාරය මගින් ඉහළ ප්‍රතිලාභ ලැබිය හැකි අතර, සමාජයට සහ පරිසරයට සිදුවන අයහපත් ප්‍රතිඵල අවම කරමින් මිනිසුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කළ හැක. ප්‍රවර්ධන උපක්‍රමයන්හි කොටසක් ලෙස අදාළ නියෝජිතයන් සහ විදේශීය සම්බන්ධතා තුලින් ශ්‍රී ලංකාව පිළිබඳව පවතින අදහස් සහ අයහපත් ප්‍රචාරණයන් කළමනාකරණය කළ යුතුය. මේ අනුව ඉතා ඉක්මණින් ඩොලර් බිලියනයක කර්මාන්තයක් බවට පත්වීමට හැකියාව ඇති අතර එය සිදුවිය හැක්කේ සියළුම කොටස්කරුවන් මෙම අභියෝගය භාරගතහොත් පමණි.

4. 2005 අංක 38 දරන සංචාරක පනත